වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

# ANNUAL REPORT

# 2014




කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

விவசாயப் பட்டப் பின் படிப்பு நிறுவனம்
பேராதனைப் பல்கலைக்கழகம்

**POSTGRADUATE INSTITUTE OF AGRICULTURE**
**UNIVERSITY OF PERADENIYA**

# වාර්ෂික වාර්තාව

# 2014




කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
පේරාදෙණිය විශ්ව විද්‍යාලය

## පටුන


ආයතනයේ දැක්ම හා මෙහෙවර i
ආයතනයේ සංවිධාන ව්‍යුහය ii
කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෝ iii

**1.** 2014.12.31 දිනෙන් අවසන් වූ වසර සඳහා ආයතනයේ ප්‍රගතිය පිළිබඳ අධ්‍යක්ෂතුමාගේ සමාලෝචන වාර්තාව 01
- 1.1 හැඳින්වීම 01
- 1.2 අධ්‍යයන හා පර්යේෂණ කටයුතු 01
- 1.3 වාර්ෂික සම්මේලනය 03
- 1.4 සාක්ෂාත් කර ගන්නා ලද ඉලක්ක 03
- 1.5 මුහුණ දුන් අසමාර්ථතා හා ඒයට බලපෑ සාධාරණ හේතු 03
- 1.6 අනාගත සැලසුම් 03

2. ආයතනික සම්පත් හා සිසුන් පිළිබඳ තොරතුරු 05

3. 2014 දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සිටි ස්ථිර කාර්ය මණ්ඩලය 07

4. 2014 දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සිටි ස්ථිර අනධ්‍යයන කාර්ය මණ්ඩලය 08
- 4.1 බඳවා ගැනීම් 08
- 4.2 විශ්‍රාම ගැනීම් 08
- 4.3 ආයතනයේ කාර්යය මණ්ඩලය සහභාගි වූ පුහුණු වැඩසටහන් 09

5. 2014 වර්ෂයේදී කරන ලද පර්යේෂණ, නව සොයා ගැනීම්, හා ප්‍රකාශන 10

6. 2014 වර්ෂයේදී පවත්වන ලද වැඩසටහන්, සම්මන්ත්‍රණ ,සමුළු, හා වැඩමුළු 11

7. 2014 වර්ෂයේදී පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු වැඩසටහන් වැඩමුළු, හා කෙටිකාලීන පාඨමාලා 12

8. 2014 වර්ෂයේදී පවත්වන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු වැඩසටහන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කෙටිකාලීන පාඨමාලා 14

9. 2014 වර්ෂයේ දී අත්සන් කරන ලද ජාත්‍යන්තර ගිවිසුම් / අවබෝධතා ගිවිසුම් පිළිබඳ 14

10. 2014 වර්ෂයේදී ආයතනික කාර්ය මණ්ඩලය හා සිසුන් විසින් ලබා ගන්නා ලද සම්මාන 14

11. 2014 වර්ෂයේදී ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර 15

12. වාර්ෂික පර්යේෂණ සම්මේලනය 16

13. සාමාන්‍ය පරිපාලනය 18

14. කෘෂි විද්‍යාපීඨ පුස්තකාලයේ වාර්ෂික වාර්තාව 20

15. ආයතනයේ මූල්‍ය කාර්යය සාධනය – 2014 22
- 15.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර 22
- 15.2 මූලධන වියදම් පිළිබඳ විස්තර 23
- 15.3 ව්‍යවස්ථාපිත වාර්තා හා අනාවරණ 24

16. විගණන කමිටු වාර්තාව 43

## දැක්ම

ශ්‍රී ලංකාවේ කෘෂිකර්මාන්තයට හා ගෝලීය ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීම පිණිස කෘෂිකර්මාන්තයට හා එයට අදාළ අනෙකුත් අංශයන්හි පශ්චාත් උපාධි හා පර්යේෂණ කටයුතු කිරීමෙහි ලා විශිෂ්ඨත්වයකින් හෙබි කලාපීය මධ්‍යස්ථානයක් බවට පත් වීම.

## මෙහෙවර

පශ්චාත් අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථානයක් ලෙස සිය සේවාව ලබා දෙමින්, උසස් ගුණාත්මක බවින් යුත් ඉගැන්වීම් හා පර්යේෂණ තුළින් අධ්‍යාපනික වශයෙන් උසස් ප්‍රායෝගිකත්වයට නැඹුරු වූ පුහුණුවක් ලබා දීම හා කෘෂිකර්මාන්තයට හා එයට අදාළ අනෙකුත් ක්ෂේත්‍රයන්ට ධනාත්මක දායකත්වයක් සපයන්නා වූ ප්‍රවීනතාවයෙන් හෙබි සේවයට කැප වූ වෘත්තිකයින් පිරිසක් බිහි කිරීම.

## ඉලක්ක

1. විශිෂ්ටත්වයෙන් හෙබි අධ්‍යයන ප්‍රමිතියක් අත් කර ගැනීම
2. පශ්චාත් උපාධි අධ්‍යයන හා පර්යේෂණ කටයුතුවල විශිෂ්ටත්වයක් අත්කර ගත් ජාතික හා අන්තර්ජාතික ආයතනයක් ලෙස පිළිගැනීමක් ලබා ගැනීම
3. පර්යේෂණ හා නව්‍යතා සංස්කෘතියක් ඇති කිරීම
4. මූල්‍යමය ශක්‍යතාවයෙන් යුත් ආයතනයක් බවට පත් වීම

## කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ සංවිධාන ව්‍යූහය



**කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ කළමනාකරණ මණ්ඩලය (2014)**

1) මහාචාර්ය බීසී එන් පීරිස් - අධ්‍යක්ෂ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය
2) ඩග්ලස් නානායක්කාර මහතා - අතිරේක ලේකම් (උසස් අධ්‍යාපන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
3) ආචාර්ය ඒ ජේ සතරසිංහ -අධ්‍යක්ෂ ජනරාල්, ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව (මුදල් අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
4) ආර් එම් ඩී බී මීගස්මුල්ල මයා, ලේකම්, කෘෂිකර්ම අමාත්‍යංශය නියෝජනය කිරීම සඳහා
5) ලේකම්,වැවිලි කර්මාන්ත අමාත්‍යංශය නියෝජනය කිරීම සඳහා
6) එච් එල් තිසේරා මයා, ලේකම් - පශු සම්පත් සංවර්ධන අමාත්‍යංශයේ ලේකම් නියෝජනය සඳහා
7) කේ ඒ අයි ඩී සිල්වා මයා අධ්‍යක්ෂ ප්‍රතිපත්ති හා සැලසුම් ( පරිසර අමාත්‍යංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා)
8) අනුර සතුරුසිංහ මයා - වන සංරක්ෂක - පර්යේෂණ හා අධ්‍යාපන - (වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා නියෝජනය කිරීම සඳහා)
9) ආචාර්ය ජේ ඩී සමරසිංහ - සභාපති (කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාව CARP)
10) ආචාර්ය රොහාන් විජේකෝන් - අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
11) ආචාර්ය ඩී ආර් ටී ජී රත්නායක මයා- අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
12) එන් කේ ඒ රූපසිංහ මයා - අධ්‍යක්ෂ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
13) ආචාර්ය එච් ඒ ජේ ගුණතිලක - අධ්‍යක්ෂ පොල් පර්යේෂණ ආයතනය
14) මහාචාර්ය කේ සමරසිංහ - පීඨාධිපති කෘෂිකර්ම විද්‍යාපීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
15) මහාචාර්ය එස් සුබසිංහ - පීඨාධිපති කෘෂිකර්ම පීඨය රුහුණු විශ්ව විද්‍යාලය
16) ආචාර්ය ඒ ඩී අම්පිටියවත්ත - පීඨාධිපති කෘෂිකර්ම පීඨය සබරගමුව විශ්ව විද්‍යාලය
17) මහාචාර්ය ඩී බී ටී එස් ජී අත්තනායක - පීඨාධිපති කෘෂිකර්ම පීඨය වයඹ විශ්ව විද්‍යාලය
18) ආචාර්ය එම් ජී ටී එස් අමරසේකර - පීඨාධිපති කෘෂිකර්ම පීඨය රජරට විශ්ව විද්‍යාලය
19) ආචාර්ය පී සිවරාජා- පීඨාධිපති කෘෂිකර්ම පීඨය නැගෙනහිර විශ්ව විද්‍යාලය
20) ආචාර්ය එස් සිවචන්ද්‍රන්- පීඨාධිපති කෘෂිකර්ම පීඨය යාපනය විශ්ව විද්‍යාලය
21) මහාචාර්ය එච් බී එස් ආරියරත්න - පීඨාධිපති පශු වෛද්‍ය හා සත්ව විද්‍යා පීඨය පේරාදෙණිය විශ්ව විද්‍යාලය
22) මහාචාර්ය වී ඒ සුමණසිංහ - කෘෂිකර්ම ජීව විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
23) මහාචාර්ය එච් එල් ජේ වීරහේවා - කෘෂි ආර්ථික විද්‍යාව පිළිබඳ අධ්‍යයන මණ්ඩලය
24) මහාචාර්ය ඊ ආර් එන් ගුණවර්ධන - කෘෂි ඉංජිනේරු විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
25) ආචාර්ය එච් වී ඒ වික්‍රමසූරිය - කෘෂිකර්ම ව්‍යාප්තිය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
26) මහාචාර්ය එච් ඩබ්ලිව් සිරිල් - සත්ව විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
27) ආචාර්ය පී එල් පීරිස් - ජීව සංඛ්‍යාන විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
28) ආචාර්ය ශාමලා කුමාර් - ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
29) ආචාර්ය එච්එම් පී එස් බී හිටිනායක - බෝග විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
30) මහාචාර්ය ඩී පී එන් පී විජේසිංහ - ආහාර විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
31) ආචාර්ය ඩී එම් ද කොස්තා - පැලෑටි ආරක්ෂණය පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය
32) මහාචාර්ය ඒ එන් ජයකොඩි - පාංශු විද්‍යාව පිළිබඳ අධ්‍යයන කාර්ය මණ්ඩලය

**විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පත්කරන ලද නියෝජිතයින්**

33) මහාචාර්ය ආර් පී ද සිල්වා -
34) ආචාර්ය එස් එස් ඊ රණවන
35) ආචාර්ය ඩී බී ටී විජේරත්න මයා
36) මහාචාර්ය එස් කේ පින්නවල
37) මහාචාර්ය බී එස් බී කරුණාරත්න

## 1. ආයතනයේ ප්‍රගතිය පිළිබඳව 2014 වර්ෂයට අදාළව එහි අධ්‍යක්ෂ මහාචාර්ය එස් සමිත මහතා විසින් ඉදිරිපත් කරන ලද සමාලෝචන වාර්තාව.

### 1.1 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ පශ්චාත් උපාධි අධ්‍යයන පාඨමාලා පවත්වනු ලබන ප්‍රමුඛ පෙළේ ආයතනයක් ලෙස කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය 1979 අංක 9 දරණ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පණත මගින් 1979 වර්ෂයේදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධව ස්ථාපනය කරන ලදි. කෘෂිකර්ම විෂයයට අයත් විවිධ විෂය ක්ෂේත්‍ර ,කෘෂිකර්ම අමාත්‍යංශය., පශු සම්පත්., පරිසර හා වන සම්පත්., වැවිලි කර්මාන්ත , උසස් අධ්‍යාපන ,සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය යනාදී අමාත්‍යංශ නියෝජනය කරන්නා වූ සුවිශේෂී පුද්ගලයන්ගෙන් සැදුම්ලත් කළමණාකරන මණ්ඩලයක් වෙත ආයතනයේ පාලනය පවරනු ලැබ ඇත. පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා ශ්‍රී ලංකාව තුලම අවශ්‍යය අවකාශ සැලසීම හා රටේ සීඝ්‍රයෙන් ව්‍යාප්ත වන කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා මනාව පුහුණු කරන ලද විද්‍යාත්මක දැනුමෙන් පිරි වෘත්තිකයින් බිහි කිරීම මෙම ආයතනය ස්ථාපනය කිරීමේ පරම අභිලාෂය විය. බලාපොරොත්තු වූ පරිදි මෙම ආයතනය අඩසියවසකට අඩු කාලයක් තුළදී ජාතික අවශ්‍යතා සපුරාලීමට සමත් වී ඇති අතර, පරිසර දූෂණය ,ආහාරවල සෞඛ්‍යාරක්ෂාව (Food safety) ආහාර සුරකෂිතතාව (Food Security), හා ජෛව විවිධත්වය යනාදිය හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ මතුව තිබෙන නව අභියෝග වලට මුහුණ දීම සඳහා අවශ්‍ය නව උපක්‍රම තව දුරටත් සොයා ගනිමින් සිටියි.

### 1.2 අධ්‍යයන හා පර්යේෂණ කටයුතු:

ඉතා ශක්තිමත් හා මනා පලපුරුද්දෙන් යුත් අනධ්‍යයන කාර්ය මණ්ඩලයක සහය ඇතිව කෘෂිකර්ම පීඨයේ සහ මෙම ආයතනය සතුව ඇති නවීනතම පහසුකම් වලින් යුත් රසායනාගාර, තොරතුරු තාකෂණාගාර , පුස්තකාල හා දේශනශාලා යනාදිය භාවිත කරමින් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යාපීඨයේ ද වෙනත් විශ්ව විද්‍යාලවල පෞද්ගලික ආයතන වල හා අදාල වෙනත් සංවිධාන වල කෘෂිකර්ම ක්ෂේත්‍රයේ විවිධ ක්ෂේත්‍ර පිළිබඳ විශේෂඥතාවයින්ගෙන් හෙබි 300 දෙනෙකුට අධික බාහිර කථිකාචාර්ය මණ්ඩලයක් විසින් අධ්‍යයන මණ්ඩල 11 ක් හරහා අදාළ ඉගැන්වීම් කටයුතු සිදු කරනු ලැබේ. මෙම ආයතනය විසින් පශ්චාත් උපාධි ඩිප්ලොමා පාඨමාලා දෙකක් ඇතුලත්ව වර්තමානයේ උපාධි පාඨමාලා 35 ක් පිරිනමනු ලබන අතර ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති උපාධිය (M.B.A) ,දර්ශනපති උපාධිය (M.phil), හා දර්ශනශූරී උපාධිය හා ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ දර්ශනශූරී උපාධිය ඇතුළුව පශ්චාත් උපාධි පාඨමාලා 29 ක් පවත්වනු ලැබේ. මෙම ආයතනයට වාර්ෂිකව සිසුන් 400-450 අතර ප්‍රමාණයක් බඳවා ගනු ලබන අතර , මෙහි විවිධ ජාතීන්ට අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවෝ 2000 ක් පමණ අධ්‍යයන කටයුතු වල නිරත වෙති. **"සාමාන්‍ය තත්වයට වඩා විචෘතය"** යන පේරාදෙණිය විශ්ව විද්‍යාලීය ආදර්ශ පාඨයට අනුව බඳවා ගනු ලබන ශිෂ්‍ය ශිෂ්‍යාවන් විශ්ව විද්‍යාල පද්ධතිය තුල සිටින සෑම පීඨයකටම අයත් ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගෙන් සමන්විත වේ. විමර්ශනයට භාජනය වී ඇති කාල සීමාව තුළ පහත සඳහන් පරිදි අධ්‍යයන මණ්ඩල 11 ක් යටතේ සිසුන් 482 දෙනෙකු ලියාපදිංචි කරනු ලැබ ඇත.:

**ඝානා රාජ්‍යයේ සිසුන් 16 දෙනෙකු ද ඇතුලත්ව අධ්‍යයන මණ්ඩල 11 ක් විසින් පවත්වනු ලබන පශ්චාත් උපාධි පාඨමාලා 26 ක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන් පිළිබඳ විස්තර.**

විද්‍යාපති උපාධි පාඨමාලා 26 ක් සඳහා - 376
ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ අධ්‍යයන මණ්ඩලය විසින් පවත්වනු ලබන
ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ විද්‍යාපති පාඨමාලාව සඳහා - 45
දර්ශනපති උපාධි පාඨමාලාව සඳහා - 37
දර්ශනශූරී උපාධිය සඳහා - 21
තාවකාලික පදනම මත - 03

ඉහත සඳහන් පරිදි සිසුන් 345 ක් සිය පශ්චාත් උපාධි පාඨමාලා සම්පූර්ණ කර ඇත.
(ස්ත්‍රී පුරුෂ වශයෙන් පිළිවෙලින් වෙන් කොට දක්වා ඇත)

රටේ ජාතික අවශ්‍යතා කෙරෙහි ප්‍රායෝගිකව අවධානය යොමු කරමින් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සිය අධ්‍යයනය හා පර්යේෂණ පදනම තවදුරටත් සඵලදායී බවට පත් කරමින් හා ශක්තිමත් බවට පත් කරමින් සිටී. විමර්ශනයට භාජනය වී ඇති කාල සීමාව තුළ ඉහත කී ඉතා සුවිශේෂී වැදගත්කමකින් යුත් කාර්යයන් සපුරා ගැනීම සඳහා විවිධ විෂය ක්ෂේත්‍රයන්ට සම්බන්ධ විශේෂඥයින්ගේ සහභාගිතය අනුව සියළුම අධ්‍යයන මණ්ඩලවල සමස්ථ විෂය මාලා(Curriculum) සංශෝධනය කරන ලදී.මෙයට අමතරව සියළුම පාර්ශවකරුවන්ගේ සක්‍රිය දායකත්වය ඇතිව එසේ සංශෝධනය කරන ලද විෂය මාලා ඇතුලත්කොට 2014 අධ්‍යයන වර්ෂය සඳහා ඇතුලත් කර ගනු ලබන ශිෂ්‍ය කණ්ඩායමට ලබා දීම සඳහා නව ශිෂ්‍ය අත්පොතක් මුද්‍රණය කරන ලදී. එසේම නව පශ්චාත් උපාධි පාඨමාලා දෙකක් හඳුන්වා දීමට සැලසුම්කොට ඇති අතර උපාධිධාරී ශ්‍රම බලකායේ දැනුම වැඩි දියුණු කිරීමට හා රැකියා විරහිත උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය ඉහළ නැංවීම පිණිස නව පාඨමාලා ඒකක බොහෝමයක් හඳුන්වා දුන් අතර,දැනට පවතින විෂය මාලාවට නවීකරනය කරන ලද පාඨමාලා ඒකක ඇතුලත් කිරීමට ද කටයුතු කරන ලදී.

## 1.3 වාර්ෂික සම්මේලනය

පර්යේෂණය තුළින් ලබාගත් නව දැනුම පිළිබඳ සාකච්ඡා කිරීමට , එය බෙදා හදා ගැනීමට එකී දැනුම ව්‍යාප්ත කර හැරීම සඳහා දේශීය හා විදේශීය පර්යේෂකයින් ආයතනයේ කාර්යය මණ්ඩලයට හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් හට වේදිකාවක් වූ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ 26 වන වාර්ෂික සම්මේලනය එහි ආයතනික දින දර්ශනයේ සුවිශේෂී දිනයක් විය. මෙම වාර්ෂික සම්මේලනය 2014 නොවැම්බර් 21 හා 22 යන දෙදින තුල මහනුවරදී පවත්වන ලදී.මෙම සම්මේලනයේ ප්‍රධාන ආරාධිතයා ලෙස ජාත්‍යන්තර පශු සම්පත් පර්යේෂණ ආයතනයේ නැගෙනහිර හා අග්නි දිග ආසියානු කලාපය භාර කලාපීය නියෝජිත (Regional Representative for East and Southeast Asia, International livestoch Research Institute) ආචාර්ය ස්ටීව් ජේ ස්ටාල් මහතා සහභාගි වූ අතර, ඔහු විසින් විශේෂ දේශනය කරන ලදී.මෙහිදී මෙම ආයතනයේ පර්යේෂකයින් විසින් පෝස්ටර් ඉදිරිපත් කිරීම් (Poster Presentation) 24 ක් ඇතුලත්ව ඉදිරිපත් කිරීම් (Presentation) 73 ක් කරන ලදී. මෙයට අමතරව ඉන්දියාව, පකිස්ථානය ,නේපාලය , කොරියාව , ඉන්දුනීසියාව , වියට්නාමය සහ බංගලාදේශය වැනි රටවල් විසින් ඉදිරිපත් කිරීම් 37 ක් සිදු කරන ලදී. මෙම ඉදිරිපත් කිරීම් අවස්ථා 10 ක් තුලදී ඉතා සියුම් ලෙස විමර්ශනය කරන ලදී.මෙම සම්මේලනයේදී හොඳම. ඉදිරිපත් කරන්නා හට ත්‍යාග ලබා දෙන ලදී. එකී සම්මේලනයේ 2014 වාර්ෂයේ සම්බන්ධීකාරක ආචාර්ය එස් පතිරාජා මහතා විසින් ප්‍රධාන ආරාධිතයාට හා ගෞරවනීය ආරාධිතයාට Tropical Agricultural Research Vol.26(1) ග්‍රන්ථය ප්‍රදානය කරන ලදී.

## 1.4 සාක්ෂාත් කර ගන්නා ලද ඉලක්ක:

1981 වාර්ෂයේ දී ඉදිකරන ලද මෙම ආයතනය සතු ප්‍රධාන ගොඩනැගිල්ල අළුත් වැඩියා කරන ලදි. මෙහිදී ආයතනය සතුව තිබු දේශනශාලා 13 ක සංඛ්‍යාව 17 ක් දක්වා ඉහළ නංවන ලද අතර එම දේශනශාලා සඳහා නවීනතම පහසුකම් සපයන ලදි.කථිකාචාර්ය මණ්ඩලය හා සිසුන් යන දෙපිරිසටම සිය ඉගෙනුම් හා ඉගැන්වීම් ක්‍රියාවලිය පහසුවෙන් කරගෙන යා හැකි පරිදි හා ආයතනයේ බලධාරීන්ට නියමිත වෙලාවට නිසි තීරණ ගැනීමටද සිය කාර්ය මණ්ඩලයේ කාර්යක්ෂමතාව හා සඵලතායි බව ඉහළ නැංවීම පෙරදැරිකොට ගෙන අන්තර් ජාලය පදනම් කොට ගත් කළමණාකරණ තොරතුරු පද්ධතියක්(Management Information System) ස්ථාපනය කරන ලදි. රජය විසින් වෙන් කරන ලද මූල්‍යමය ප්‍රතිපාදන ආයතනයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සඵලදායී ලෙස යොදා ගෙන ඇත. පාඨමාලා ගාස්තු අය කර ගැනීම සඳහා භාවිතා කරන ලද ක්‍රමවේදයන් හා ගෙවීම් පිළිබඳ අඛණ්ඩව සොයා බැලීම හේතු කොට ගෙන පෙර වසරවල් හා සැසඳීමේදී එකී අයකර ගැනීම් වල ප්‍රගතිය 80% ක් දක්වා වර්ධනය වී ඇත.මෙය ආයතනයේ ඉතිහාසය දෙස බලන විට ආයතනය විසින් අත් කරගත් ජයග්‍රහණයක් ලෙස පෙන්වා දිය හැකිය.ස්ථාවර වත්කම් ලේඛනය කෙටුම්පත් කිරීමේ කටයුතු බොහෝමයක් අවසන් අදියරේ පවතින අතර , දශක කිහිපයක් තිස්සේ පැන නැගී තිබූ විගණන විමර්ශණ සංඛ්‍යාව ක්‍රමයෙන් අඩු කිරීමට ක්‍රමෝපායන් කිහිපයක් ගෙන ඇත.තුන්වන ශ්‍රේණියේ ලිපිකරු තනතුරු 1 ක් හා කම්කරු තනතුරු 03 ක් වශයෙන් පැවැති තනතුරු ඇබෑර්තු 04 ක් සඳහා බඳවා ගැනීම් සිදු කොට ඇත.මෙයට අමතරව පූර්ණ කාලීන අධ්‍යයන නිබන්ධකයෙකු (තාවකාලික පදනම මත) හා ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙකු බඳවා ගැනීමෙන් අධ්‍යයන මණ්ඩල වල ඉගැන්වීම් කටයුතු සඳහා පහසුකම් සලසා ඇත.එසේම කාර්යය මණ්ඩලය සඳහා නව රියදුරු තනතුරක් ඇති කිරීමට අදාළ අනුමැතිය ලැබී ඇත.

## 1.5 අසමාර්ථතා හා එයට බලපාන ලද හේතු:

විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ කැපී පෙනෙන අසමාර්ථතා වාර්තා වි නොමැත. කෙසේ වුවද දරන ලද ප්‍රයත්නයන් හා සසඳා බලන කල වාර්ෂිකව බඳවා ගනු ලබන දේශීය ශිෂ්‍ය සංඛ්‍යාව ඉහළ නැංවීමට නොහැකි වී ඇති අතර අතරමගදී පාඨමාලා හැර යන ශිෂ්‍ය සංඛ්‍යාව පහත හෙළීමට ද නොහැකි වී ඇත. එසේම ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් හඳුන්වා දුන්නද බලාපොරොත්තු වු පරිදි විදේශ සිසුන් ඇතුළත් කර ගැනීම ඉහළ නැංවීමට නොහැකි වි ඇත. ශ්‍රී ලංකාවේ අග නුවරින් දුර බැහැරව ස්ථාන ගත වීමත් විදේශීය සිසුන් සඳහා නේවාසික පහසුකම් නොමැති වීමත් ඉහත ගැටලු වලට සෘජුව බලපෑ හේතු වශයෙන් දැක්විය හැකිය. පුරප්පාඩු වූ තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය හේතු කොට ගෙන එම තනතුරු සඳහා යොමු කරනු ලැබූ අපේක්ෂකයින්ට තිබිය යුතු අවම සුදුසුකම් නොමැතිකම හේතු එම තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට සමාලෝචිත වර්ෂයේ දී නොහැකි විය.

## 1.6 අනාගත සැලසුම්:

ආයතනයේ ප්‍රධානතම අනාගත සැලසුම් වන්නේ ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි.මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා 2014 වසරේ සිට Sri Lanka Qualification Assurance Framework නිර්ණායක ප්‍රකාරව ආයතනය විසින් පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා සඳහා ප්‍රතීතනය (Accredition) ලබා ගැනීම අවශ්‍ය කටයුතු දැනටමත් ගෙන තිබේ. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා ඝානාවේ

යෙෂුආ තාක්ෂණික ආයතනය (Yeshua Institute of Technology) ආයතනය අතර අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමකට අනුව, 2014 මාර්තු මාසය වන විට අදාළ අධ්‍යයන මණ්ඩලය විසින් ජීව සංඛ්‍යාන විද්‍යාව (Bio-statistics) පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාවක් මෙරටින් බැහැරව පැවැත්වීමට කටයුතු සම්පාදනය කරමින් පවතී. ආරම්භයේදී මෙම වැඩ සටහන සඳහා ඝානාවෙන් සහ ඒ අශ්‍රිත රටවලින් සිසුන් විසිදෙනෙකු බඳවා ගැනීමට අපේක්ෂා කරන අතර සම්පාදිත අධ්‍යයන දින දර්ශනයට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය එකී පාඨමාලාව සඳහා අනුව ඝානාවට ගොස් දේශන පැවැත්වීමට නියමිතය. දැනට වෙළඳපොලේ පවතින මිල ගණන් සැළකිල්ලට ගෙන පාඨමාලා ගාස්තු වැඩි කිරීමට ආයතනය බලාපොරොත්තු වෙයි. මීට අමතරව රාජ්‍ය ව්‍යාපාර කමිටුව (COPE) විසින් නිර්දේශ කළ පරිදි මෙම ආයතනය විසින් විශේෂයෙන්ම ආහාර, පිළිබඳ පර්යේෂණ කර ගෙන යෑම සඳහා ප්‍රධාන රසායනාගාරයක් ස්ථාපිත කිරීමට නියමිත අතර එසේම කොළඹ කේන්ද්‍ර කොට ගනිමින් ආයතනයේ ශාඛාවක් ස්ථාපිත කිරීමට ද නියමිතය. පසුව එහි සාර්ථකත්වය සලකා බලා දෙවන ශාඛාව කිළිනොච්චියේ ස්ථාපිත කිරීමට ද අදහස් කෙරේ. මීට අමතරව ආයතනය සඳහා බඳවා ගනු ලබන විදේශිය ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමට ද එම සිසුන්ට නේවාසික පහසුකම් සැපයීම සඳහා පේරාදෙණිය විශ්ව විද්‍යාලය සතු ගොඩනැගිල්ලක් පවරා ගැනීමට ද ඉදිරියේදී පියවර ගනු ලැබේ. මෙම සෑම ප්‍රයත්නයකින්ම අපේක්ෂා කරනු ලබන්නේ 2014-2017 සංයුක්ත සැලැස්මේ සඳහන් එහි ප්‍රධාන අරමුණු වලින් එකක් වන මූල්‍යමය ශක්‍යතාව සාක්ෂාත් කර ගැනීමයි.

## 2. ආයතනය සතු සම්පත් සහ ලියාපදිංචි වී සිටි සිසුන් පිළිබඳ විස්තර - 2014

| පාඨමාලාව | මුළු ශිෂ්‍ය සංඛ්‍යාව | කාර්යය මණ්ඩල සංයුතිය(ස්ථිර කාර්යය මණ්ඩලය ) | | | |
|---|---|---|---|---|---|
| | | අධ්‍යයන කාර්යය මණ්ඩලය | අනධ්‍යයන කාර්යය මණ්ඩලය | අධ්‍යයන සහය කාර්ය මණ්ඩලය | එකතුව |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | | 01 | 40 | 01 | 42 |
| විද්‍යාපති(M.Sc) | 376 | | | | |
| ව්‍යාපාර කළමණාකරන විද්‍යාපති(M.BA) | 45 | | | | |
| දර්ශනපති (M.Phil) | 37 | | | | |
| දර්ශනශූරි(Ph.D) | 21 | | | | |
| අනියම්(Casual) | 03 | | | | |
| එකතුව | **482** | **01** | **40** | **01** | **42** |

වර්ෂ 2014 දෙසැම්බර් 31 දිනට ආයතනය සතුව පැවැති සම්පත් හා ලියාපදිංචි වී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව ඉහත වගුවෙන් දැක්වේ.විමර්ෂණයට භාජනය වී ඇති කාලය තුල කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් පවත්වනු ලබන විවිධ පශ්චාත් උපාධි වැඩසටහන් සඳහා ලියාපදිංචිව සිටි ශිෂ්‍ය සංඛ්‍යාව හා එහි ස්ථිර කාර්යය මණ්ඩලය මෙහි අන්තර්ගත වේ. විමර්ෂණයට භාජනය වී ඇති කාල සීමාව තුල කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සතු පුස්තකාලයේ සේවය කල ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති සහ පලමු ශ්‍රේණියේ කම්කරුවෙකු සේවයෙන් විශ්‍රාම ගොස් ඇත.

| අධ්‍යයන වැඩසටහන | 2014 වර්ෂයේ බඳවා ගැනීම් | 2013 වර්ෂයේ බඳවා ගැනීම් | 2014 වර්ෂයේ දී උපාධි පිරිනමන ලද ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | 27 |
| විද්‍යාපති(M.Sc) | 376 | 328 | 270 |
| ව්‍යාපාර කළමණාකරන විද්‍යාපති(M.BA) | 45 | 45 | 27 |
| දර්ශනපති (M.Phil) | 37 | 31 | 16 |
| දර්ශනශූරි(Ph.D) | 21 | 04 | 04 |
| අනියම් Casual | 03 | - | - |
| **Total** | **482** | **408** | **345** |

* **2009 වසරේ සිට ලියාපදිංචි වී සිටි සහ 2014 වසරේදී උපාධි ලබා පිටව ගිය පශ්චාත් උපාධිධාරීන්** විමර්ශණයට භාජනය වී ඇති වර්ෂය තුල පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලා හැදෑරීම සඳහා සිසුන් ඍජුවම බඳවා නොගත්තද පශ්චාත් උපාධි පාඨමාලා වලට අදාළ විභාග අසමත් වු සහ විස්තෘත වාචික විභාගයට (Comprehensive Examinations) පෙනී නොසිටි සිසුන් සඳහා පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතික නිකුත් කරන ලදී. පසුගිය වසර හා සසඳන කළ පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වු හා පශ්චාත් උපාධි ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාවේ වැඩි වීමක් දක්නට ලැබුණි. පහත සඳහන් ප්‍රස්ථාර වලින් 2012 , 2013 සහ 2014 යන වසර වලදී ලියාපදිංචි වු සහ උපාධි පිරිනමන ලද ශිෂ්‍ය සංඛ්‍යාව දැක්වේ.

**2012 , 2013 සහ 2014 යන වසර වලදී ලියාපදිංචි වු ශිෂ්‍ය සංඛ්‍යාව**




**2012 , 2013 සහ 2014 යන වසර වලදී උපාධි පිරිනමන ලද ශිෂ්‍ය සංඛ්‍යාව**



## පශ්චාත් උපාධි සඳහා ලියාපදිංචි වු සහ පශ්චාත් උපාධි පිරිනමන ලද විදෙස් සිසුන් සංඛ්‍යාව – 2014

| අධ්‍යයන වැඩසටහන | 2014 වර්ෂයේදී බඳවා ගන්නා ලද සංඛ්‍යාව | 2013 වර්ෂයේ දී බඳවා ගන්නා ලද සංඛ්‍යාව | 2014 වර්ෂයේ දී උප පිරිනමන ලද සංඛ්‍යා |
|---|---|---|---|
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| විද්‍යාපති(M.Sc) | 17 | 01 | 01 |
| ව්‍යාපාර පරිශීලනය පිළිබඳ විද්‍යාපති (M.B.A) | - | - | |
| දර්ශනපති | - | - | |
| දර්ශනශූරි | - | 02 | 01 |
| එකතුව | **17** | **03** | **02** |

විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුලදී පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන සහ ඝානාවේ Yesha තාක්ෂණ ආයතනය අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමකට අනුව මෙම ආයතනය විසින් ශ්‍රී ලංකාවෙන් පරිබාහිරව පශ්චාත් උපාධි සඳහා ඉගැන්වීමේ වැඩසටහනක් දියත් කරන ලදී. මෙම අවබෝධතා ගිවිසුම යටතේ, ජීව සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන මණ්ඩලය (Board of study in Bio- statistics) විසින් පවත්වනු ලබන ව්‍යවහාරික සංඛ්‍යානය පිළිබඳ විද්‍යාපති උපාධිය (M.Sc in Applied statistics) හැදෑරීම සඳහා සිසුන් 17 දෙනෙකු ලියාපදිංචි වී සිටියි. මේ අනුව බලන කල කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය එහි ප්‍රධාන කාර්ය සාධන දර්ශකයක් වන විදේශ සිසුන් ලියාපදිංචිය ඉහළ නැංවීම යන අරමුණ කරා ලගා වෙමින් සිටී.

## 3. 2014 දෙසැම්බර් 31 දිනට සිටි ස්ථිර අධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| ආයතනය | විෂය | මාධ්‍යය | ජ්‍යේෂ්ඨ මහාචාර්ය | | මහාචාර්ය | | සහය මහාචාර්ය | | ජ්‍යේෂ්ඨ කථිකාචාර්ය | | කථිකාචාර්ය | | අධ්‍යයන සහය කාර්යය මණ්ඩලය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | M | F | M | F | M | F | M | F | M | F | M | F | M | F |
| | | | **1** | | | | | | | | | | **1** | | **2** | **0** |
| | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | |
| | එකතුව | | **1** | | | | | | | | | | **1** | | **2** | **0** |

**M-** පුරුෂ **F -** ස්ත්‍රී

අධ්‍යක්ෂවරයා ද ඇතුළුව අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංයුතිය ඉහත වගුවෙන් විස්තර කෙරේ. මීට අමතරව අධ්‍යයන සහය කාර්යය මණ්ඩලයේ තනතුරක් වන වැඩසටහන්/ පද්ධති විශ්ලේෂක (System Analyst) තනතුර ද මෙයට ඇතුලත් වෙයි. ආයතනයේ අවශ්‍යතාවය මත අනුමත කාර්යය මණ්ඩල සාමාජික සංඛ්‍යාවට යටත්ව එක් ජ්‍යේෂ්ඨ මහාචාර්යවරයෙක් සහ එක් නිබන්ධන සහයකයකු (Tutor) කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා ලද අතර මෙම තනතුර සඳහා ආයතන විසින් උපයා ගන්නා ලද ආදායම් වලින් වැටුප් ගෙවනු ලැබේ.මෙම ආයතනයේ අධ්‍යයන කටයුතු 300 දෙනෙකුට අධික බාහිර කථිකාචාර්ය දේශකයන් විසින් පවත්වනු ලබන අතර ඔවුන්ගේ වැඩි දෙනෙකු පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ කථිකාචාර්යවරුන් වේ.

## 4. 2014 දෙසැම්බර් 31 දිනට සිටි ස්ථිර අනධ්‍යයන කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර

| අංශය | අති ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය | | ජ්‍යෙෂ්ඨ කාර්යය මණ්ඩලය | | කණිෂ්ඨ කාර්යය මණ්ඩලය | | සුළු සේවක | |
|---|---|---|---|---|---|---|---|---|
| අංශය | පිරිමි | ස්ත්‍රී | පිරිමි | ස්ත්‍රී | පිරිමි | ස්ත්‍රී | පිරිමි | ස්ත්‍රී |
| සාමාන්‍යය පරිපාලනය | | 03 | - | 01 | 04 | 02 | 08 | 01 |
| ශිෂ්‍ය බඳවා ගැනීම් | - | - | - | 01 | 02 | 01 | 01 | - |
| ගිණුම් | 01 | - | - | 01 | 05 | - | 01 | - |
| පුස්තකාලය | - | - | - | 02 | - | 01 | 03 | 01 |
| තොරතුරු තාක්ෂණ ඒක | | | | | 01 | - | 02 | |
| එකතුව | **01** | **03** | - | **05** | **12** | **04** | **15** | **02** |

*1.* පරිපාලන හා විධායක මට්ටම *2.* ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික ශ්‍රේණිය *3.* ලිපිකරු හා ආශ්‍රිත සේවා 4. ඉහත සඳහන් ශ්‍රේණි වලට පහළ

### 4.1 බඳවා ගැනීම්:

අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ පහත සඳහන් තොරතුරු සඳහා බඳවා ගැනීමට පියවර ගෙන තිබේ.;

1 2014 මාර්තු 18 වන දින සිට බල පැවැත්වෙන පරිදි ඊ. එම්. එන්. ඩී. ඒකනායක මිය දුරකථන ක්‍රියාකරු/පිළිගැනීමේ නිළධාරී තනතුරට බඳවා ගන්නා ලදී.

2 2014 සැප්තැම්බර් 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි කේ.ඊ.පී. ද සිල්වා මිය ඉංග්‍රිසි යතුරු ලේඛක (11 ශ්‍රේණිය ) සඳහා බඳවා ගන්නා ලදී.

### 4.2 විශ්‍රාම ගැනීම්:

2014 වර්ෂය තුළ පහත සඳහන් සේවක මහත්ම මහත්මීන් සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී

1 වසර 34 ක සේවා කාලයකින් අනතුරුව කෘෂිකර්ම පුස්තකාලයේ සේවය කළ ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපති අයි. මුදන්නායක මිය 2014 නොවැම්බර් 14 වන දින සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී. ඇය පිලිපීන විශ්ව විද්‍යාලයෙන් පුස්තකාල හා තොරතුරු විද්‍යාව පිළිබඳ පශ්චාත් ලබා ගෙන ඇති අතර .ශ්‍රී ලංකා පුස්තකාල සංගමයෙන් සාමාජිකත්වය ද දරන්නීය.

2 කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා වසර 29 ක අගනා සේවයක් සැපයීමෙන් අනතුරුව කම්කරු 01 ශ්‍රේණියේ සේවය කල කේ. පී.ජයසිංහ මහතා සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

3 කාර්යය මණ්ඩලය සඳහා ලබා ලද පුහුණු සහ එයට අදාල සංවර්ධන කටයුතු විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ සිය කාර්යය මණ්ඩලය සංවර්ධනය හා පුහුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කොට ඇත.සිය කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා අවශ්‍ය මට්ටමට වැඩි දියුණු කිරීමේ අරමුණින් පවතින සෑම පුහුණු අවස්ථාවක්ම ඔවුන් හට ලබා දීමට ආයතනය උත්සුක වී ඇත. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි

ආයතනයේ පරිපාලන කාර්යය මණ්ඩලය සහ සහය කාර්යය මණ්ඩලය සහභාගි වු පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පහත සඳහන් පරිදි වේ.

## 4.3 කාර්යය මණ්ඩලය සඳහා ලබා ලද පුහුණු සහ එයට අදාල සංවර්ධන කටයුතු

විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ ආයතනය විසින් සිය කාර්යය මණ්ඩලය සංවර්ධනය හා පුහුණු කිරීම සඳහා වැඩි අවධානයක් යොමු කොට ඇත.සිය කාර්ය මණ්ඩලයේ දැනුම හා කුසලතා අවශ්‍ය මට්ටමට වැඩි දියුණු කිරීමේ අරමුණින් පවතින සෑම පුහුණු අවස්ථාවක්ම ඔවුන් හට ලබා දීමට ආයතනය උත්සුක වී ඇත. කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පරිපාලන කාර්යය මණ්ඩලය සහ සහය කාර්යය මණ්ඩලය සහභාගි වු පුහුණු වැඩසටහන් සහ වැඩමුළු පහත පරිදි වේ.

01 නියෝජ්‍යය ලේඛනාධිකාරී සමුද්‍රිකා හේරත් මිය ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (Sri lanka Institute Marketing) විසින් 2014 ජුලි 17 වන දින පවත්වන ලද පිරිස් කළමණාකරණය පිළිබඳ එක් දින වැඩ වැඩමුළුවට සහභාගි වුවාය.

02 නියෝජ්‍යය ලේඛනාධිකාරී සමුද්‍රිකා හේරත් මිය තායිලන්තයේ කසර්ට්සාර්ට් (Kasertsart) විශ්ව විද්‍යාලයේ සංවර්ධනය හා සන්නිවේදනය සඳහා වු ජාත්‍යන්තර මධ්‍යස්ථානය විසින් 2014 නොවැම්බර් 11 සිට 21 දින දක්වා පවත්වන ලද සහභාගිත්ව මෙහෙයුම් හා ඇගයීම් (Participatory Monitoring and Evaluation) පිළිබඳ දෙසති පුහුණු වැඩසටහනකට සහභාගි වුවාය.

03 නියෝජ්‍යය ලේඛනාධිකාරී සමුද්‍රිකා හේරත් මිය ජ්‍යේෂ්ඨ සහකාර මුල්‍යාධිකාරී බී.ජී.එස්.පී. ජයකොඩි මහතා සහ සහකාර ලේඛනාධිකාරී කේ.එස්.කේ. හේරත් මිය, උසස් අධ්‍යාපන අමාත්‍යංශය විසින් 2014 දෙසැම්බර් 12 - 13 පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ දී පවත්වන ලද මුල්‍ය නොවන කළමණාකරුවන් සඳහා මුල්‍ය කළමණාකරණය (Financial Management for Non-Financial Managers) පිළිබඳ දෙදින වැඩමුළුවකට සහභාගි වුහ.

04 අධ්‍යක්ෂතුමාගේ ජ්‍යේෂ්ඨ පුද්ගලික ලේකම් සී.දහනායක මහත්මිය 2014 ජනවාරි 23 -24 යන දිනයන් හිදි සිංගප්පුරුවේදි පවත්වන ලද " Executive PA Excellence" යන වැඩමුළුවට සහභාගි වුවාය.

05 ජ්‍යේෂ්ඨ කාර්යය මණ්ඩල සහයක ( යතුරු ලේඛන සේවයේ) එස්.හපුආරච්චි මහත්මිය තරුණ කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය විසින් පවත්වන ලද "Secretarial Development" නම් වු වැඩමුළුවට ද පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද "යතුරු ලේඛිකාවන් සඳහා පෞරුෂ සංවර්ධන" යන වැඩමුළුවට ද සහභාගි වුවාය.

06 දුරකථන ක්‍රියාකරු/ පිළිගැනීමේ නිළධාරී ඊ. එම්. එන්. ඩී. ඒකනායක මිය 2014 අප්‍රේල් 25 වන දින යෞවන කටයුතු හා නිපුනතා සංවර්ධන අමාත්‍යංශය විසින් පවත්වන ලද "Telephone skills and Etiquette Training for Secretaries and Front office staff" යන එක් දින වැඩමුළුවට සහභාගි වුවාය.

07 කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සියලුම කාර්යය මණ්ඩලය , 2014 දෙසැම්බර් 15 සහ 16 යන දෙදින තුළ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ කාර්යය මණ්ඩලය සංවර්ධන මධ්‍යස්ථානය විසින් පවත්වන ලද " Empowering Yourself"යන වැඩමුළුවකට සහභාගි වුහ.

## 5. 2014 වසරේදී කරන ලද පර්යේෂණ,නව සොයා ගැනීම් සහ ප්‍රකාශන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රකාශයට පත් කරන ලද | අලෙවි කිරීම සඳහා | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| පර්යේෂණ | -- | -- | 85 * |
| නව සොයා ගැනීම් | -- | -- | -- |
| සඟරා | 04 | 04 | 04 |
| පොත් | 03 | 03 | 03 |
| ලිපි | 73 | -- | 73** |
| වෙනත් | -- | -- | -- |
| **එකතුව** | **80** | **07** | **165** |

* 33 - කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබවිද්‍යාපති (M.B.A) උපාධිය සම්පූර්ණ කරන ලද සිසුන් විසින් කරන ලද ඉදිරිපත් කිරීම්(Presentations)

12 -කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පර්යේෂණ පහසුකම් සැපයීමේ අරමුදලේ(Research Facilitating Fund) ශිෂ්‍යත්වලාභීන් සිසුන් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ වල ප්‍රගතිය පිළිබඳ ඉදිරිපත් කිරීම්.

40 - විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ දර්ශනපති (M.Phil) සහ දර්ශනශූරි(Ph.D) උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වූ ආයතනයේ සිසුන් විසින් කරන ලද පර්යේෂණ යෝජනා පිළිබඳ ඉදිරිපත් කිරීම්.

**73 - විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ දර්ශනපති (M.Phil) සහ දර්ශනශූරි(Ph.D) උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වීම සම්බන්ධයෙන් ආයතනයේ සිසුන් විසින් වාර්ෂික පර්යේෂණ සැසි වාරයේදී කළ ඉදිරිපත් කිරීම්. (පෝස්ටර් ඉදිරිපත් කිරීම් ඇතුළත්ව)

## 6. 2014 වර්ෂයේ දී පවත්වන ලද වැඩ සටහන් , සම්මන්ත්‍රණ සහ වැඩමුළු පිළිබඳ විස්තර

| විෂය | සහභාගි වන ලද | සම්පූර්ණ කරන ලද | ඉදිරිපත් කරන ලද |
|---|---|---|---|
| පශ්චාත් උපාධි | 29 | -- | 29 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| උපාධි වැඩ සටහන් | - | - | - |
| ඩිප්ලෝමා වැඩ සටහන් | - | - | - |
| සහතික පත්‍ර වැඩ සටහන් | -- | -- | -- |
| පර්යේෂණ සංක්ෂේප (Abstra | 54*+24** | -- | 78 |
| පොත් පරිච්ඡේද | -- | -- | -- |
| ඉදිරිපත් කිරීම් | 54*+24** | -- | 78 |
| Working Papers | -- | -- | -- |
| පුහුණු වැඩසටහන් | 21 | | |
| වැඩමුළු | 330 | 09 | |
| සම්මන්ත්‍රණ | 19 | | 19 |
| වෙනත් | | | |

* ආරාධිත ඉදිරිපත් කිරීම් 05 ක් ඇතුලත් වේ.

** 24 කථන ඉදිරිපත් කිරීම්

## 7. 2014 වර්ෂයේදී පවත්වන ලද සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණු වැඩසටහන් වැඩමුළු, හා කෙටිකාලීන පාඨමාලා

| අංශය | කාර්යය/මාතෘකාව | ආයතනය | සහභාගි වූ සංඛ්‍යාව | පවත්වන ලද දින ගණන |
|---|---|---|---|---|
| 1. | පාංශු ශාක, ජල සහ පොහොර විශ්ලේෂණය | පාංශු විද්‍යා අධ්‍යයන මණ්ඩලය | 30 | පෙබ. 17-21 |
| 2. | බහු විචල්‍යය දත්ත විශ්ලේෂණය | ජීව සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන මණ්ඩලය | 53 | පෙබ. 24-26 |
| 3. | වර්ශික ආහාර බෝගයන්හි තත්ව සහතික ලත් බීජ නිෂ්පාදන සඳහා තාක්ෂණික අවශ්‍යතාව | බෝග විද්‍යා අධ්‍යයන මණ්ඩලය | 27 | පෙබ.26, මාර්තු 01 |
| 4. | බහු විචල්‍යය දත්ත විශ්ලේෂණය | ජීව සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන මණ්ඩලය | 53 | මාර්තු 10-12 |
| 5. | නායකත්ව පුහුණු වැඩසටහන් | කෘෂිකර්ම ව්‍යාප්ති අධ්‍යයන මණ්ඩලය | 51 | මාර්තු 14-16 |
| 6. | පරීක්ෂණ සැලසුම් කිරීම හා විශ්ලේෂණය | ජීව සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන මණ්ඩලය | 24 | අප්‍රේල් 28-30 |
| 7. | ශ්‍රේණිගත හා එකතු කළ දත්ත විශ්ලේෂණ | ජීව සංඛ්‍යාන විද්‍යා අධ්‍යයන මණ්ඩලය | 39 | සැප්. 23-26 |
| 8. | ජල වෘත්තිකයන්ගේ සංසද දින වැඩ මුළුව | කෘෂිකර්ම ඉංජිනේරු විද්‍යා අධ්‍යයන මණ්ඩලය | 60 | ඔක්. 01 |
| 9. | ලෝක ආහාර දින වැඩමුළුව | මහනුවර සිංහ සමාජය සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය | 125 | ඔක්. 16 |
| 10. | පැළෑටි සංරක්ෂණය තාක්‍ෂණය පිළිබඳ වැඩමුළුව | පැළෑටි සංරක්ෂණය අධ්‍යයන මණ්ඩලය | 20 | නොවැ.24 දෙසැ.5 |
| 11. | කාර්යය මණ්ඩල සවි බල ගැන්වීමේ වැඩමුළුව | කෘ.ප.උ. සහ පේ.වි.වි. කාර්යය මණ්ඩල සංවර්ධන මධ්‍යස්ථානය | 33 | දෙසැ.15-16 |




"Empowering Yourself" යන තේමාව යටතේ පවත්වන ලද පෞරුෂ සංවර්ධන දෙදින වැඩමුළුවට සහභාගී වූ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කාර්යය මණ්ඩලය



නායකත්ව පුහුණු වැඩසටහන - කණ්ඩායම් වැඩ

## 8. 2014 වර්ෂයේ දී පවත්වන ලද ජාත්‍යන්තර සම්මන්ත්‍රණ , වැඩමුළු , පුහුණු වැඩසටහන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ කෙටිකාලීන පාඨමාලා පිළිබඳ විස්තර

| සංඛ්‍යාව | කාර්යය /තේමාව | පීඨය/දෙපාර්තමේන්තුව/ මධ්‍යස්ථානය/ඒකකය/ පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙ | සහභාගී වූ සංඛ්‍යාව | පවත්වන ලද දිනය |
|---|---|---|---|---|
| කිසිවක් නැත | | | | |

## 9. 2014 වසරේදී අත්සන් කරන ලද ජාත්‍යන්තර ගිවිසුම්/ අවබෝධතා ගිවිසුම් පිළිබඳ විස්තර

| අංකය | ආයතනය | පීඨය/දෙපාර්තමේන්තුව/ මධ්‍යස්ථානය/ඒකකය/ පේරාදෙණිය විශ්ව විද්‍යාල | තේමාව | අත්සන් කරන ලද දිනය |
|---|---|---|---|---|
| කිසිවක් නැත | | | | |

## 10. 2014 වසරේදී කාර්යය මණ්ඩල සාමාජිකයින් සහ සිසුන් විසින් ලබා ගන්නා ලද සම්මාන පිළිබඳ විස්තර

| විෂය | ප්‍රදානය කරන ලද සම්මාන | අධ්‍යන කාර්යය මණ්ඩලය | සිසුන් සංඛ්‍යාව |
|---|---|---|---|
| දේශීය සම්මාන | 14 | | 14 |
| ජාතික සම්මාන | 01 | 03 | 03 |
| ජාත්‍යන්තර සම්මාන | 01 | | 01 |
| වෙනත් | - | | |
| එකතුව | 16 | 02 | 16 |

සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය ලැබූ සම්මාන පිළිබඳ විස්තර ඉහත වගුවේ දැක්වේ. 2014 වසරේ වාර්ෂික සම්මේලනයේ දී සිසුන් විසින් ඉදිරිපත් කරන ලද හොඳම ඉදිරිපත් කිරීම් (Presentation) වෙනුවෙන් සම්මාන 14 ක් ද ජෝකිම් ( Joachim) අනුස්මරණ සම්මානය ද ප්‍රදානය කරන ලදී. මෙම සියලුම සම්මාන දේශීය හා ජාතික වශයෙන් ප්‍රදානය කරන ලදී.

ජාතික විද්‍යා පදනම විසින් පවත්වනු ලැබූ පර්යේෂණ සම්මාන ප්‍රදානය කිරීමේ දී භෝග විද්‍යා දෙපාර්තමේන්තුවේ මහාචාර්ය ඩබ්.ඒ.ජේ.එම්. ද කොස්තා , ආචාර්ය ඒ ආර් එෆ් සහරා සහ පැළෑටි සංරක්ෂණය අධ්‍යන මණ්ඩලයේ ආචාර්ය ඩී එම් කොස්තා යන මහත්ම මහත්මීන් විසින් ඉදිරිපත් කරන ලද Expression of candidate genes for salt

tolerance in Sri lankan rice germplasm යන පර්යේෂණය සඳහා විශේෂ පැසසුම් සම්මාන සහතිකයක් 2014 වර්ෂයේ දී ප්‍රදානය කරන ලදී. මෙම පර්යේෂණය සඳහා ජාතික විද්‍යා පදනම සහ ජාන ඉංජිනේරු විද්‍යාව සහ ජෛව තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර මධ්‍යස්ථානය (ICGEB) විසින් අරමුදල් සම්පාදනය කරන ලදී.

මීට අමතරව දර්ශනශූරී (Ph.D)උපාධි පාඨමාලාව සඳහා පාංශු විද්‍යා අධ්‍යන මණ්ඩලය යටතේ ලියාපදිංචි වූ ජේ ඒ එස් චතුරිකා ශිෂ්‍යාට ඇමරිකා එක්සත් ජනපදයේ ජාත්‍යන්තර ශාක පෝෂණ ආයතනය විසින් 2014 වසර සඳහා වන ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරන ලදී. මේ සඳහා ලෝකයේ සෑම රටකම පිහිටා ඇති විශ්ව විද්‍යාල රාශියක ඉහළ සුදුසුකම් සහිත අපේක්ෂකයින් අතරින් තෝරා ගන්නා ලද සිසුන් 30 දෙනෙකුගේ කණ්ඩායමක් තෝරා ගන්නා ලද අතර ඇය ද එම කණ්ඩායමේ සාමාජිකාවක් වීම විශේෂත්වයකි.

## 11. 2014 වසරේදී ආරම්භ වූ නව පාඨමාලා පිළිබඳ විස්තර

සමාලෝචිත වර්ෂයේදී මතු දැක්වෙන නව පශ්චාත් උපාධි පාඨමාලා ආරම්භ කිරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලැබුණ ද , ඒ සඳහා ලියාපදිංචිය කිරීම 2015 වර්ෂයේ දී සිදු කිරීමට නියමිතය. දැනටත් සිසුන් කිහිපදෙනෙකු මෙම උපාධි පාඨමාලා සඳහා ලියාපදිංචි වී ඇති අතර ඒවායේ අධ්‍යයන කටයුතු 2015.02.28 වන දින සිට ආරම්භ වීමට නියමිතය.

I. වැවිලි කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව
II. උද්‍යාන විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධි පාඨමාලාව

## 12. වාර්ෂික පර්යේෂණ සම්මේලනය (Annual Congress)




ඡායාරූපය - 2013 වර්ෂයේදි පවත්වන ලද වාර්ෂික සම්මේලනයේ සමාරම්භක උළෙල

මෙම ආයතනයේ වාර්ෂික පර්යේෂණ කාර්යය 2014 නොවැම්බර් 20 -21 යන දෙදින තුළ ජාත්‍යන්තර පශු සම්පත් හා පර්යේෂණ ආයතනයේ (International Livestock and Research Institute) නැගෙනහිර හා අග්නි දිග ආසියානු කලාපීය නියෝජිත ආචාර්ය ස්ටීව් ජේ ස්ටාල් මහතාගේ ප්‍රධානත්වයෙන් අති උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී. මෙම සම්මේලනයේ දී පශ්චාත් උපාධි ආයතනයේ විද්‍යාර්ථයින් මෙන්ම ඉන්දියාව, පකිස්ථානය ,නේපාලය , කොරියාව , ඉන්දුනීසියාව , වියට්නාමය සහ බංගලාදේශය යන රටවල් නියෝජනය කරමින් සහභාගී වූ පර්යේෂකයින් විසින් පෝස්ටර් ඉදිරිපත් කිරීම් ද ඇතුලත්ව ඉදිරිපත් කිරීම් 78 ක් සිදු කරන ලදී.

පහත නම් සඳහන් සිසුහු කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 26 වන වාර්ෂික සම්මේලනයේ හොඳම ඉදිරිපත් කරන්නන් ලෙස සම්මාන ලැබූහ.

එම්. ඩී. එෆ්. අබේකෝන් - සත්ත්ව ජාන සම්පත් වල විවිධත්වය හා ඇගයීම

රනිත්රී අබේනායක - ආහාර , ආහාර සත්ත්ව සහ පෝෂණය

එන්. එස්. විතානගේ ජල සම්පත් කළමණාකරනය

ඩබ්. ඒ. ඩී. ජයවර්ධන - අනුක ජීව විද්‍යාව හා ජෛව තාක්ෂණය

එම්. එස්. එල්. ආර්. සී. මාරසිංහ - Bio – SystemEngineering and Remote Sensing

එච්.ඒ.ආර්.කේ.ජයවර්ධන - ශෂ්‍ය විද්‍යාව හා පැළෑටි අභිජනනය




කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අධ්‍යක්ෂකතුමා විසින් සම්මේලනයේ හොඳම ඉදිරිපත් කිරීම් කරන ලද සිසුන් අතරින් එක් ශිෂ්‍යයෙක් සඳහා සම්මාන සහතික ප්‍රදානය කිරීම.

එම්. ඩී. කල්පගේ - පැළෑටි සංරක්ෂණය

සැම්සන් අන්ක්රා - සංඛ්‍යානය හා ආර්ථික විද්‍යාව

ඊ. එම්. හේරත් - පෝස්ටර් ඉදිරිපත් කිරීම්

ආර්. පී. ලියනගේ - හොඳම ඉදිරිපත් කිරීම් අතරින් විශිෂ්ඨම ඉදිරිපත් කිරීම

ආර් පී ලියනගේ - සත්ත්ව ජාන සම්පත් වැඩි දියණ කිරීම හා

ආර් එම් එස් විජේරත්න - කෘෂිකර්ම ව්‍යාප්තිය හා අධ්‍යාපනය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 26 වන වාර්ෂික සම්මේලනයේදි ආර්. පී. ලියනගේ මහතා හොඳම ඉදිරිපත් කිරීම අතරින් ද විශිෂ්ඨම ඉදිරිපත් කිරීම ලෙස සම්මානයට පාත්‍ර විය.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් 2014 වසරේ දී පවත්වන ලද අවසාන විභාගයේ දී ඉහළම සාමාන්‍යය ශ්‍රේණි අගය (GPA) ලබා ගත් කෘෂිකර්ම ජීව විද්‍යා අධ්‍යයන මණ්ඩලයේ ආර් එන් නවරත්න මියට එම ආයතනයේ 26 වන වාර්ෂික සම්මේලනයේදි ජෝකිම් (Joachim) අනුස්මරණ සම්මානය ප්‍රදානය කරන ලදි.

# 13. සාමාන්‍ය පරිපාලනය

## 13.1 යටිතල පහසුකම් සංවර්ධනය:



අධ්‍යයන හා පර්යේෂණ අංශයන් හි ඉහළ කාර්යය සාධනයක් පවත්වා ගැනීම සඳහා අවශ්‍ය වන්නා වු ඉගෙනුම් , ඉගැන්වීම් හා භෞතික පරිසරය මූලිකම අවශ්‍යතා වන බැවින් එම පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය දැඩි අවධානයක් යොමු කරයි. එබැවින් විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ , මෙම ආයතනය රජයෙන් ලබා දෙන ඉතා සුලු ප්‍රාග්ධන ප්‍රතිපාදන උපයෝජනය කරමින් පහත සඳහන් ඉදිකිරීම් කටයුතු සඳහා ප්‍රමුඛතාව ලබා දෙන ලද අතර එම කටයුතු සඳහා අවශ්‍ය මූලික ක්‍රියාවලි දැනටමත් සම්පාදනය කොට ඇත. රජයෙන් ලබා දෙන අරමුදල් වලින් පමණක් එකී ව්‍යාපෘති ක්‍රියාත්මක කළ නොහැකි අතර එම කාර්යයන් සඳහා වැය වෙතයි බලාපොරොත්තු වන ඉතිරිය මේ වන විටත් ආයතනය විසින් උත්පාදනය කරනු ලබන අරමුදල වලින් වෙන්කොට ඇති අතර වියදම් ද දරා ඇත.

1. අංක 01 ගොඩනැගිල්ලේ වැසිකිලි ඒකකය සහ ආපන ශාලාව අලුත් වැඩියා කිරීම හා ඉදිකිරීම් කටයුතු
2. සරප් කවුන්ටරය සඳහා ආවරණයක් සවි කිරීම
3. උද්‍යාන අලංකරණ සඳහා සැලසුම් කිරීම හා අවශ්‍ය සැලසුම් සම්පාදනය කිරීම
4. ගොඩනැගිලි අංක 02 සඳහා වහලයක් ඉදිකිරීම
5. පර්යේෂණ සිසුන්ට ඉහළ මාලය සඳහා නේවාසිකාගාර පහසුකම් සැලස්ම හඳුනා ගන්නා ලද ගොඩනැගිලි සංකීර්ණය ප්‍රතිපාදනයට අවශ්‍ය කටයුතු කිරීම
6. ආහාර සම්බන්ධ පරීක්ෂණ සඳහා රසායනාගාරයක් ඉදි කිරීම

ආයතනය විසින් ආහාර සම්බන්ධ පරීක්ෂණ සඳහා රසායනාගාරයක් තැනීම සඳහා සැලසුම් කළද එයට උචිත ස්ථානයක් සොයා ගැනීමට අපහසු වූ හෙයින් එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි විය. අනෙක් අතට මෙම රසායනාගාර වෙනුවට, පශ්චාත් උපාධි හදාරණ සිසුන් සියලු දෙනාටම සහ පර්යේෂණ කටයුතු සඳහා පරිහරණය කළ හැකි පරිදි පොදු රසායනාගාරයක් තැනීමටද ආයතනයේ අවධානය යොමු වී තිබේ. කෘෂි විද්‍යා ඉංජිනේරු දෙපාර්තමේන්තුව විසින් පවරා දෙන ලද එකී දෙපාර්තමේන්තුවට අයත් මී වතුරේ පිහිටි පැරණි ගොඩනැගිලි සංකීර්ණය පිළිසකර කොට විශේෂයෙන්ම පර්යේෂණ හා විදේශ සිසුන්ගේ ප්‍රයෝජනය සඳහා නේවාසිකාගාරයක් බවට පත් කිරීමට සැලසුම් කොට තිබුණ ද කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශන සේවා සපයනු ලබන මධ්‍යම පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ උපදෙස් මත එකී ව්‍යාපෘතිය අත්හැර දැමීමට සිදු විය. කෙසේ වුවද ,විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුල පේරාදෙණිය විශ්ව විද්‍යාලයෙන් ලබා දීමට නියමිත භූමි භාගයක විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සමඟ ද ඒකාබද්ධ වී පශ්චාත් උපාධිලාභී විද්‍යාර්ථයින් හට නේවාසිකාගාර සංකීර්ණයක් ඉදි කිරීමට අවශ්‍ය මූලික පියවර ආයතනයේ අධ්‍යක්ෂකවරයා විසින් ගෙන තිබේ. එසේම වාර්ෂිකව සිදු කරන පරිදි විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුල පන්ති කාමර දේශන ශාලා සහ ශ්‍රවණාගාරයේ ඉගැනුම් සහ ඉගැන්වීම් පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා සැළකිය යුතු ප්‍රමාණයෙන් අරමුදල් වැය කිරීමට ආයතනය විසින් කටයුතු කර ඇත.

## 13.2 කළමණාකරණ තොරතුරු පද්ධතිය (MIS):

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ස්ථාපිත කොට ඇති කළමණාකරණ තොරතුරු පද්ධතිය ක්‍රමිකව හා ස්ථාවරව ක්‍රියාත්මක වෙමින් පවතී. විමර්ෂණයට භාජනය වී ඇති වර්ෂය තුළ , ආයතනයේ පද්ධති විශ්ලේෂක විසින් ප්‍රසම්පාදන කටයුතු , ගිණුම් කටයුතු හා ගබඩා කටයුතු ස්වයංක්‍රීයව සිදු කිරීමට හැකි වන පරිදි එම පද්ධතිය නවීකරණය කිරීමට පියවර ගෙන තිබේ.මෙම තොරතුරු පද්ධතිය භාවිත කරන්නන් හට පහසුකම් සැලසීමේ අරමුණින් එහි ධාරිතාවය වැඩි කර තිබේ.එමගින් මෙම ආයතනයේ ලියාපදිංචිව ඇති සිසුන්ට , දේශකවරුන්ට හා පර්යේෂකයන්ට මෙන්ම තොරතුරු ලබා ගැනීමට අපේක්ෂා කරන බාහිර පුද්ගලයින්ට පහසුවෙන්ම එකී තොරතුරු පද්ධතියට ප්‍රවිශ්ඨ විය හැකිය.මෙම කාර්යය සඳහා අවශ්‍ය වියදම් ආයතනය විසින් උත්පාදිත අරමුදල් වලින් සිදු කරන ලදී.

2014 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලසුම් , සංයුක්ත සැලසුම් , ක්‍රියාකාරි සැලසුම් යනාදිය සකස් කිරීම ද එමෙන්ම කළමනාකරණ මණ්ඩල , සම්බන්ධීකරන කමිටු විගණන කමිටු යනාදිය රැස්වීම්,සකසා ඇති වාර සටහනට පැවැත් වූ අතර සැළසුම් කරන ලද පරිදි වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙදී සම්පූර්ණ කරන ලදී. විමර්ෂිත වර්ෂය සඳහා විගණකාධිපති විසින් නගන ලද විගණන විමසුම් වලින් පෙන්වා දී ඇති දුර්වලතා සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දී ඇති අතර ඔහු විසින් පෙන්වා දෙන ලද අඩුපාඩු මග හරවා ගැනීමට අවශ්‍ය පියවර ද ගෙන තිබේ.

අධ්‍යයන හා පර්යේෂණ කටයුතු සම්බන්ධයෙන් බල පැවැත්වෙන නීති හා රෙගුලාසි සංශෝධනය කොට ඇති අතර ආයතනික පද්ධති ශක්තිමත් කිරීමට හා පැවැති අඩුපාඩු මග හරවා ගැනීමට අවශ්‍ය නව නීති රීති හා රෙගුලාසි සම්පාදනය කොට ඇත. අවශ්‍ය අවස්ථා වලදී ඒවා ක්‍රියාත්මක කිරීම පිණිස දේශකවරුන් හා සිසුන් දැනුවත් කරනු ලැබේ. පර්යේෂණ උපාධි වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා ඒවා නිසි වෙලාවට සම්පූර්ණ කිරීම සම්බන්ධව විශේෂ අවධානයක් සමාලෝචිත වර්ෂයේදී ද යොමු කරන ලදී.

## 13.3 සුබ සාධන හා විනෝද

විමර්ශනයට භාජනය වී ඇති වර්ෂය තුළ සාමාජීය වගකීමක් ඇති ආයතනයක් ලෙස , මතු සඳහන් ක්‍රියාකාරකම් දියත් කරන ලදී.

1 ආයතනයේ කාර්යය මණ්ඩලය හා සිය පවුල් වල සාමාජිකයින්ගේ සහභාගීත්වයෙන් සිංහල දෙමළ අලුත් අවුරුද්ද සැමරීම සඳහා බක්මහ උළෙලක් 2014 මැයි 01 දින පේරාදෙණිය විශ්ව විද්‍යාලීය ක්‍රීඩාංගනයේදී උත්කර්ෂවත් ලෙස පවත්වන ලදී.

2 කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ සුබ සාධක සංගමයේ සංවිධානයෙන් , මහනුවර මහ රෝහලේ ප්‍රසව හා නාරිවේදය පිළිබඳ විශේෂඥ වෛද්‍යය සර්ධා හේමප්‍රිය මහතා විසින් "ගුණාත්මක ජීවිතයක් සඳහා උපදෙස් හා මග පෙන්වීම"(Instructions and Guidance for Quality Life) මැයෙන් දේශනයක් 2014 සැප්තැම්බර් 09 වන දින ආයතනයේ දී පවත්වන ලදී.

3 ආයතනික කාර්යය මණ්ඩලයෙන් හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයින් අතර සුහදත්වය වර්ධනය කිරීමේ අරමුණින් සිදු කරනු ලබන විනෝද චාරිකාව 2014 පෙබරවාරි 02 දින සිදු කළ අතර මැදිරිගිරිය සෝමාවති චෛත්‍ය රාජ්‍යා නැරඹීමට ඔවුනට අවස්ථාව සලසා දෙන ලදී.

## ක්‍රීඩා කටයුතු ඃ

පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් වාර්ෂිකව පවත්වනු ලබන ක්‍රීඩා උළෙලට ආයතනික කාර්යය මණ්ඩලයේ සාමාජිකයින්ගෙ සහභාගිත්වය පෙර වසර වලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේ ද සිදු විය.

1. පේරාදෙණිය විශ්ව විද්‍යාලය විසින් පවත්වනු ලබන වාර්ෂික ක්‍රිකට් තරගයේදී කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයේ ක්‍රිකට් කණ්ඩායම ශූරතාව දිනා ගන්නා ලදී.
2. එසේම ආයතනයේ රොෂාන් බුද්ධික ජයතිලක මහතා එකී වර්ෂය තුළ රාජ්‍යය සේවා C කාණ්ඩයේ ක්‍රිකට් ශූරතාව දිනා ගත් පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කර ඇත.

## 14. කෘෂිකර්ම විද්‍යා පුස්තකාලය

වගු අංක 01 ඃ 2014 වර්ෂයේ දී පුස්තකාලය සඳහා ලැබුණු ප්‍රතිපාදන

| | |
|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන | Rs.500,000.00 |
| කෘෂිකර්ම විද්‍යා පීඨය විසින් වෙන් කරන ලද ප්‍රතිපාදන | Rs.383,172.82 |
| එකතුව | **Rs.883,172.82** |

අත්පත් කර ගැනීම් - පොත් සහ වාර සඟරා අත්පත් කර ගැනීම.

කෘෂිකර්ම විද්‍යා පීඨයේ සහ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්ය මණ්ඩලය එකී ආයතන දෙක විසින් සිදු කරනු ලබන ඉගැන්වීම් කටයුතු වලට වඩාත්ම ගැලපෙන පරිදි නිර්දේශ කරන ලද පාඨ ග්‍රන්ථ ද ඇතුලත්ව පොත් 241 ක් 2014 වර්ෂයේදී පුස්තකාලයේ පොත් සංචිතයට එකතු විය.

වගු අංක 02 ඃ පුස්තකාලය පොත් සංචිතයට එකතු වූ පොත් පිළිබඳ විස්තර

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් වලින් මිලදී ගන්නා ලද පොත් | 35 | 263,030.85 |
| කෘෂිකර්ම විද්‍යා පීඨයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන වලින් මිලදී ගන්නා ලද පොත් | 30 | 409,540.22 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා කෘෂිකර්ම විද්‍යා පීඨය යන ආයතන දෙකෙන්ම මිලදී ගත් මුළු පොත් සංඛ්‍යාව | 65 | |
| සංචිතයට එකතු වූ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ පශ්චාත් උපාධි පර්යේෂණ නිබන්ධන | 19 | |

වගු අංක 03 ඃ පරිත්‍යාග

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| වෙනත් පරිත්‍යාගශීලීන්ගේ ලද පොත් සංඛ්‍යාව | 175 | 265,804.02 |
| සංචිතයට එකතු වූ මුළු පොත් සංඛ්‍යාව ( මිලදී ගැනීම් + පරිත්‍යාග ) | 241 | |

වගු අංක 04 ඃ වාර සඟරා

| විස්තරය | සංඛ්‍යාව | වටිනාකම |
|---|---|---|
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් වලින් ඇනවුම් කරන ලද වාර සඟරා සංඛ්‍යාව | 05 | 64,548.99 |
| කෘෂිකර්ම විද්‍යා පීඨ ප්‍රතිපාදන වලින් ඇනවුම් කරන ලද වාර සඟරා සංඛ්‍යාව | 01 | 540.00 |
| කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සහ කෘෂිකර්ම විද්‍යා පීඨය මඟින් ඇනවුම් කරන ලද මුළු වාර සඟරා සංඛ්‍යාව | **06** | **65,088.99** |

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ අරමුදල් වලින් විදේශීය වාර සඟරා ද ඇතුලත්ව වාර සඟරා 5ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී දායකත්වය දරා ඇත.

වගු අංක 05 ඃ පුස්තකාලය පරිහරණය කරනු ලැබූ පුද්ගල කොට්ඨාශ

| වර්ගය | සංඛ්‍යාව |
|---|---|
| පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් | 1064 |
| උපාධි අපේක්ෂක සිසුන් | 1217 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය(ස්ථිර) | 228 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය (තාවකාලික) | 14 |
| ලිපිකරු හා සමාන්තර සේවා | 06 |
| පුස්තකාලය කෙටි කාලීනව භාවිතා කරන්නන් | 46 |
| **එකතුව** | **2575** |

**පුස්තකාලයේ පොත් භාවිතය**

2014 වර්ෂය තුලදී ආචාර්ය මණ්ඩලය හා සිසුන් අතර සංසරණය වු මුළු පොත් සංඛ්‍යාව 5356 කි.

**පුස්තකාල අතර ණය පදනම මත පොත්පත් හුවමාරු කර ගැනීම ඃ**

සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකාවේ වෙනත් විශ්ව විද්‍යාල වලින් ණය පදනම මත කියවීම් අවශ්‍යතාවයන් සඳහා ඉල්ලීම් 13 ක් ලැබී තිබුණ අතර එම ඉල්ලීම් 13 අතරින් ලිපි 03ක් සඳහා කරන ලද ඉල්ලීම් ඉටු කර ගැනීමට අපිට හැකි වුණෙමු. එසේම අන්තර්ගත පිටු සම්පාදනය වෙනත් පුස්තකාල වලින් එවැනිම ඉල්ලීම් 26 ක් ලැබුණු අතර එකි ඉල්ලීම් ලිපි 04 ක් සඳහා පමණක් අවශ්‍ය ලිපි  සැපයීමට කෘෂි පුස්තකාලය සමත් විය.

**කෘෂිකර්ම තොරතුරු ජාලය  -  Agriculture  Information Network (AGRINET)**

AGRINET Content Page  සේවාව යටතේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ආයතන සමාලෝචිත වර්ෂයේදී කෘෂිකාර්මික ආයතන වල සේවය කරනු ලබන පර්යේෂකයින්ගේ හා විද්‍යාඥයින්ගේ ප්‍රයෝජනය සඳහා Journal Content Pages කෘෂිකර්ම පුස්තකාල අතර බෙදා හරින ලදී. මෙම වැඩ සටහන යටතේ කෘෂිකර්ම පුස්තකාලය විද්‍යාඥයින් හට Journal Content Pages 18 ක් සපයා ඇත.

**ලිපි පරීක්ෂාව**

2014 වර්ෂයේදී කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මෙන්ම කෘෂි විද්‍යා පීඨයේ සිසුන් විසින් විවිධ පර්යේෂණයන්ට අදාළව ලියවුණු පරීක්ෂණාත්මක ලිපි සොයා බැලීම සඳහා CAB CD - ROM  දත්ත පදනම භාවිතා කරන ලද අතර 76 වාරයක් එවැනි විමසුම් එම දත්ත ගබඩාව හරහා සිදු කොට ඇත.

**Tropical Agricultural Research ග්‍රන්ථය විකිණීම හා හුවමාරු කර ගැනීම.**

මෙම ග්‍රන්ථය අලෙවි කිරීමේ කටයුතු කෘෂිකර්ම පුස්තකාලය විසින් සිදු කරනු ලැබේ.

2012 වසරේදී අලෙවි කරන ලද පිටපත් සංඛ්‍යාව(සම්පූර්ණ වෙළුම) - 13
අනෙකුත් ආයතන වල ප්‍රකාශන හේතුවෙන් හුවමාරු කර ගන්නා ලද පිටපත් සංඛ්‍යාව - 12
(ප්‍රකාශයට පත් කිරීම සඳහා)

**වෙනත් පුස්තකාල සහයෝගීතා ක්‍රියාකාරකම්ඃ**

බාහිර කාර්යය මණ්ඩලයක් විසින් 2014.07.24 සිට 2014.08.11  දින දක්වා කාලය තුල කෘෂි පුස්තකාලයේ වාර්ෂික තොග සමීක්ෂණය සිදු කරන ලදී.

**කෘෂිකර්ම පුස්තකාලයේ පොත්පත් හා වාර සඟරා පිළිබඳ විද්‍යුත් සංසරණ පද්ධතිය ක්‍රියාත්මක කිරීම**

"Alice" නැමති මෘදුකාංග භාවිතා කරමින් පොත්පත් හා වාර සඟරා පිළිබඳ විස්තර විද්‍යුත් සංසරණ පද්ධතිය හරහා ක්‍රියාත්මක කිරීමේ මුලික කටයුතු 2014 නොවැම්බර් 13 වන දින ආරම්භ කරන ලදී.
මෙම පද්ධතිය ස්ථාපනය කිරීම තුලින් වැඩි කාර්යක්ෂමතාවයකින් යුතුව මෙම කාර්යයන් සිදු කළ හැකි විය.

## 15. මූල්‍ය කාර්යය සාධනය

### 15.1 පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තරඃ

| විෂය | 2012 (Rs.) | | 2013 (Rs.) | | 2014 (Rs.) | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කරන ලද ප්‍රතිපාදන | ලැබුණු ප්‍රතිපාදන | වෙන් කරන ලද ප්‍රතිපාදන | ලැබුණු ප්‍රතිපාදන | වෙන් කරන ලද ප්‍රතිපාදන | ලැබුණු ප්‍රතිපාදන |
| (අ)පුද්ගල පඩිනඩි | **44,764,000** | 39,408,203 | **41,203,000** | 39,911,697 | **50,445,000** | 46,896,435 |
| (ආ)ගමන් වියදම් | **255,000** | 69,593 | **100,000** | 97,158 | **900,000** | 92,045 |
| (ඇ)සැපයුම් | **3,173,000** | 2,992,028 | **3,625,000** | 3,362,729 | **3,990,000** | 3,851,235 |
| (ඈ)නඩත්තු කටයුතු | **1,451,000** | 737,389 | **985,000** | 1,239,819 | **1,400,000** | 1,019,205 |
| (ඉ)ගිවිසුම් ගත සේවා | **6,076,000** | 5,158,518 | **5,635,000** | 5,448,947 | **8,840,000** | 6,766,142 |
| (ඊ)වෙනත් | **19,910,000** | 9,598,707 | **18,290,000** | 19,021,554 | **22,480,000** | 35,069,716 |
| **එකතුව** | **75,629,000** | **57,964,438** | **69,838,000** | **69,081,905** | **88,055,000** | **93,694,777** |
| <u>මූල්‍යනය කළ ආකාරයඃ-</u> | | | | | | |
| රජයේ ප්‍රතිපාදන | **15,400,000** | | **19,000,000** | | **16,080,000** | |
| ප්‍රතිශතයක් ලෙස | **20%** | | **27%** | | **18%** | |
| ආයතනය විසින් උත්පාදනය කරන ලද අරමුදල් | **60,229,000** | | **50,838,000** | | **71,975,000** | |
| ප්‍රතිශතයක් ලෙස | **80%** | | **73%** | | **82%** | |




මහා භාණ්ඩාගාරය විසින් 2014 වසරේ දී ආයතනයේ පුනරාවර්තන වියදම් සඳහා රුපියල් මිලියන 16.08 ක් ද මූලධන වියදම් සඳහා රුපියල් මිලියන 9.0 ක් ද වෙන් කරන ලදී.පෙර වසර හා සසඳන කල පුනරාවර්තන හා මූල ධන වියදම් සඳහා ලැබූ ප්‍රතිපාදන මිලියන 3.0 ක් හා මිලියන 0.2 ප්‍රමාණයකින් අඩු වී ඇත. පුනරාවර්තන සහ මූලධන වියදම් සඳහා ආයතනයෙන් පිළිවෙලින් මිලියන 94.05 ක් සහ රු. මිලියන 15.76 ක් ද වැය කොට ඇත. මුළු පුනරාවර්තන වියදම සඳහා ආයතනයේ උත්පාදිත අරමුදල් වලින් (82%) හා ඉතිරිය (18%) ඒකාබද්ධ අරමුදලින් දරණ ලදී. එයින් 50.24% ක් ම ආයතනයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ සහ බාහිර කථිකාචාර්යවරුන්ගේ වැටුප් හා

වේතන ගෙවීමට වැය කර ඇත.එකී වර්ෂය තුළ ඉතිරි ප්‍රතිපාදන වලින් (37.29%) ක් පාඨමාලා සඳහා අවශ්‍ය පොත්පත් (Course Materials) මිලදී ගැනීමට, විශේෂ සේවා සඳහා ගෙවීමට ද විශ්ව විද්‍යාල කථිකාචාර්යවරුන් සඳහා ප්‍රවාහන දීමනා ගෙවීමට සහ වාර්ෂික පර්යේෂණ සම්මේලනයේ(Annual Congress) වියදම් දැරීම සඳහා ද වැය කරන ලදි. සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් වල සංයුතිය ඉහත රූප සටහනෙන් දැක්වේ.

**15.2 මූලධන වියදම් පිළිබඳ විස්තර**

| විෂය | 2012 (Rs.) | | 2013 (Rs.) | | 2014 (Rs.) | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කරන ලද ප්‍රතිපාදන | ලැබුණු ප්‍රතිපාදන | වෙන් කරන ලද ප්‍රතිපාදන | ලැබුණු ප්‍රතිපාදන | වෙන් කරන ලද ප්‍රතිපාදන | ලැබුණු ප්‍රතිපාදන |
| (අ)ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 2,000,000 | 2,988,881 | 2,500,000 | 3,976,203 | 6,050,000 | 7,623,417 |
| (ආ)රසායනාගාර හා ඉගැන්වීම් උපකරණ මිලදී ගැනීම | - | 667,520 | - | - | 1,600,000 | 1,340,392 |
| (ඇ)ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම හා වැඩිදියුණු කිරීම | 7,800,000 | 267,937 | 6,706,000 | 8,430,449 | - | 4,929,799 |
| (ඈ)රථවාහන | - | 8,350,000 | - | - | 350,000 | 389,831 |
| (ඉ) වෙනත් - පුස්තකාල පොත් සහ වාර සඟරා මිලදී ගැනීම | 1,500,000 | 8,023 | - | 996,409 | 500,000 | 1,058,161 |
| (ඊ)ක්‍රීඩා භාණ්ඩ මිලදී ගැනීම | | | | | 500,000 | - |
| (උ)දුරකථන පද්ධති මිලදී ගැනීම | | | | | - | 426,328 |
| එකතුව | **9,800,000** | **12,282,361** | **9,206,000** | **13,403,062** | **9,000,000** | **15,767,929** |

**2014 මූල ධන වියදම් වල සංයුතිය**



මූලධන ආයෝජන අය වැයෙන් 31% ක් එනම් ආසන්න වශයෙන් රුපියල් මිලියන 4.93ක් ආයතනයේ අංක 01 ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වැය කළ අතර, 48% ක්, එනම් රු. මිලියන 7.62 ක් පන්ති කාමරවල හා පරිගණක කාමරයේ පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා වෙන් කරන ලදී.මෙයට අමතරව කෘෂිකර්ම විද්‍යා පීඨ පුස්තකාලය සඳහා අවශ්‍ය පොත් පත් සහ වාර සඟරා මිලදී ගැනීම සඳහා රුපියල් මිලියන 1.05 ට ආසන්න මුදලක් වැය කරන ලදී.අදාළ වර්ෂය තුළ දරන ලද මූලධන වියදම් වල සංයුතිය ඉහත රූප සටහනේ නිරූපනය කොට ඇත.

**පේරාදෙණිය විශ්ව විද්‍යාලයට අනුබද්ධිතව ක්‍රියාත්මක වන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේදී අනුගමනය කරන ලද ව්‍යවස්ථායික වාර්තාකරණ හා වැදගත් ගිණුම් ප්‍රතිපත්ති**

**1) සාමාන්‍යය**

2014 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ මුදල් වර්ෂය සඳහා වූ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය ප්‍රකාශනය 1979 අංක 09 දරණ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන ආඥා පනතේ 12(3)(ඉ) සහ 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතේ අංක 106(1) සහ 107(ආ) වගන්තිය සහ ඉන්පසුව නීති ප්‍රකාරව කරන ලද සංශෝධන හා 1971 අංක 38 දරණ මුදල් පනත ප්‍රකාරව සකස් කොට ඇත.

**2) අනුගමනය කරන ලද වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති**

**2.1 ගිණුම්කරණයට මුල් වූ පදනම.**

අදාළ වර්ෂය සඳහා ආයතනයේ මුදල් ප්‍රකාශනය පිළිවෙලින් 2009 සහ 2012 වර්ෂයන්හි දී ප්‍රකාශයට පත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් 1 වන වෙළුම හා 11 වන වෙළුම ප්‍රකාරව ද ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් ප්‍රකාශිත ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලවද පිළියෙල කොට ඇත.

ආයතනයේ මූල්‍ය ප්‍රකාශන , 1995 අංක 15 දරණ පනත මගින් ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිතීන් පිළිබඳ පනතේ විධිවිධානවලට යටත්ව භාවිතා කරන ලද ගිණුම්කරණ සම්මතයන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මතයන්ට (Historical Cost Convention) අනුව පිළියෙල කොට ඇත.

මූල්‍ය වාර්තාකරණය මෙන්ම අදාළ අනෙකුත් ප්‍රධාන අංග වන වාහන පරිපාලනය , අතිකාල ගෙවීම් පාලනය, වාර්ෂික තොග සත්‍යාපනය/ තොග ලේඛන සත්‍යාපනය/පුස්තකාල ද්‍රව්‍ය සත්‍යාපනය, නොපියවූ ශිෂ්‍ය ගෙවීම් යනාදිය අය කර ගැනීම, ස්ථාවර වත්කම් ලේඛනය සැකසීම, විද්‍යුත් හැඳුනුම්පත් ක්‍රමය හා සම්බන්ධ ගැටළු නිරාකරණය හා ආපසු ගෙවන පුස්තකාල තැන්පතු ආදිය ගෙවීම් වැනි අදාළ අනෙකුත් ප්‍රධාන අංශ සම්බන්ධයෙන් ආයතනයේ අභ්‍යන්තර පාලන කටයුතුවල සාර්ථකභාවයද විගණන කමිටුව විසින් සමාලෝචනය කරන ලද අතර නිරාකරණය නොවූ ගැටළු විසඳා ගැනීමට අවශ්‍ය කරන මග පෙන්වීම ලබාදී අභ්‍යන්තර පාලන ක්‍රම සවිබල ගැන්වීම පිණිස අවශ්‍ය නිර්දේශ ලබා දෙන ලදී. ගිණුම්කරණ කටයුතු සඳහා සකසන ලද ක්‍රියා පටිපාටි අත්පොතක්, ආයතනයේ මූල්‍ය ක්‍රියාකාරිත්වය මෙන්ම සමස්ථ ක්‍රියාකාරිත්වයද වැඩිදියුණු කර ගැනීම සඳහා යොදා ගැනීම පිණිස නිර්දේශ කොට ඇත. තවද, පසුගිය වර්ෂ සඳහා වූ පාඨමාලා ගාස්තු වලින් ලැබිය යුතු මුදල් සම්බන්ධයෙන් ආයතනය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා විගණන කමිටුව විසින් සලකා බලන ලද අතර ශිෂ්‍යයින්ගෙන් අධ්‍යය යුතු ශේෂ සත්‍යාපනය කිරීමෙන් අනතුරුව ඒවා පොත්වලට ගැනීමට දැනටමත් කටයුතු සලසා ඇත.

**ඊ. විගණන කමිටු රැස්වීම්**

2014 දෙසැම්බර් 31 දිනට අවසන් වූ වසර තුළ විගණන කමිටු රැස්වීම් 4ක් පවත්වන ලදී රජයේ විගණන දෙපාර්තමේන්තුවේ විගණන අධිකාරීවරයා සහ ආයතනයේ අධ්‍යක්ෂවරයාද ආරාධනා මත නිරීක්ෂකයින් වශයෙන් විගණන කමිටු රැස්වීම් වලට සහභාගී වූහ. මීට අමතරව, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයේ පීඨාධිපතිවරයාද විගණන කමිටුවේ සාමාජිකයෙකු වශයෙන් පත් කරන ලදී.

5. අවසානය

විගණන කමිටුව විසින් දෙන ලද නියෝගවලට අනුව බලධාරීන් විසින් ගනු ලැබූ මූලාරම්භයෙන්, අත්කරගෙන ඇති ප්‍රගතිය, ආයතනයේ අභ්‍යන්තර පාලන ක්‍රමවල සාර්ථකත්වය හා ස්ථාවර වත්කම් ලේඛනය සැකසීමේදී හා වසර 2014 දී ආයතනයේ ක්‍රියාත්මක වූ විද්‍යුත් හැඳුනුම්පත් ක්‍රමයට අදාළ ගැටළු වැනි පවත්නා ගැටළු සම්බන්ධයෙන් කමිටුව විසින් ලබා දී ඇති නිර්දේශ මත ගන්නා ලද පසු විපරම් ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් විගණන කමිටුව සෑහීමට පත් වී ඇත. මෙහි ප්‍රතිපළලයක් වශයෙන් 2014.12.31 දිනෙන් අවසන් වන වසර සඳහා ආයතනයේ අවසන් ගිණුම් වෙනුවෙන් කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය විගණන මතයකට ලක් වනු ඇතැයි කමිටුව විසින් සඳහන් කොට ඇත.

**අත්සන් කළේ**

**ආචාර්ය අමර සතරසිංහ/ සභාපති/ විගණන කමිටුව කළමණාකරණ මණ්ඩල සාමාජික/ අති. අධ්‍යක්ෂක ජනරාල් ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව/ කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනය/ පේරාදෙණිය වි.වි.**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : සිඑල්-1/කේඩී/ජේ/පීජීඅයිඒ/01/2014/04

ඔබේ අංකය / உமது இல. / Your No. :

දිනය / திகதி / Date : 2015 අගෝස්තු 11 දින.

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත් :-

1. ලේකම් - උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය
2. ලේකම් - මුදල් අමාත්‍යාංශය
3. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
4. උපකුලපති - පේරාදෙණිය විශ්වවිද්‍යාලය

DR / SAB / AR
J.n.c.
20/08/2015



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. : සිඑල්-1/කේඩ්/ජේ/පිජිඅයිඒ/01/ 2014/04 ඔබේ අංකය / உமது இல. / Your No. : දිනය / திகதி / Date : 2015 අගෝස්තු 11 දින.

අධ්‍යක්ෂ,

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(1) උපවගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අංක 68/11 සහ 1979 දෙසැම්බර් 26 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශිත නියමාවලියේ 20 වන වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය, 108 සහ 111 වගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(1) උප වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළයුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය ප්‍රකාර, විස්තරාත්මක වාර්තාවක් ආයතනයේ අධ්‍යක්ෂ වෙත 2015 මාර්තු 25 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

-----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමණාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හා 92 වගන්තිය ප්‍රකාර තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන නමුත් ක්ෂය කිරීමෙන් ශුන්‍ය අගයට පත්ව ඇති පිරිවැය රු. 88,136,603 ක් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර අගය ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

කාර්යාල උපකරණ යටතේ ගිණුම්ගත කර තිබූ රු. 2,800,000 ක පරිගණක තොරතුරු පද්ධතිය අස්පෘශ්‍ය වත්කමක් ලෙස ගිණුම්ගත කර, ක්‍රමක්ෂය ලෙස කපා හැරීම ආයතනයේ ප්‍රතිපත්තිය වුවද, එයට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

සමාලෝචිත වර්ෂයේ එකතුව රු. 27,159,533 ක් වූ ගිණුම් විෂයයන් 04 ක ඒවා ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි.

| විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂිය |
|---|---|---|
| | රු. | |
| උපචිත වියදම් | 1,094,418 | උපලේඛන |
| ලැබිය යුතු පාඨමාලා ගාස්තු | 1,188,468 | උපලේඛන හා ශේෂ සනාථ |
| ඉදිරියට ලද පාඨමාලා ගාස්තු | 24,114,499 | - එම - |
| නිලධාරීන් 05 දෙනෙකු සඳහා පර්යේෂණ දීමනා ගෙවීම. | 762,148 | අනුමත පර්යේෂණ යෝජනා |
| | 27,159,533 | |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

1974 සිට 2004 කාලපරාසය තුළ ශිෂ්‍යයින් විසින් විද්‍යා තැන්පතු හා පුස්තකාල තැන්පතු ලෙස ගෙවා තිබූ රු. 280,010 ක් නිදහස් කිරීමට හෝ ආයතනයේ ආදායමට ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

පහත සඳහන් නීති, රීතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1974 අංක 02 දරන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ | |
| (i) 14 ඡේදය | අධ්‍යයන කමිටුවල සංයුතිය ආයතනයේ අධ්‍යක්ෂවරයා ඇතුළු සාමාජික සංඛ්‍යාව 09 කින් සමන්විත විය යුතු නමුත්, අධ්‍යයන කමිටුවල සාමාජිකයින් සහභාගීවීම සතුටුදායක තත්ත්වයේ නොපවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. |
| (ii) 14 (7) උපඡේදය | වසරක් සඳහා අවම තරමින් රැස්වීම් වාර 06 ක් අධ්‍යයන මණ්ඩල රැස්වීම් පැවැත්විය යුතු වුවද, සමාලෝචිත වර්ෂයේදී කෘෂිකර්ම ආර්ථික විද්‍යා අධ්‍යයන කමිටුවේ සහ ආහාර විද්‍යා හා තාක්ෂණික මධ්‍යස්ථාන කමිටුවේ රැස්වීම් පවත්වා තිබුණේ වාර 05 බැගිනි. |
| (ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය | අධ්‍යයන දීමනා ජීවන වියදම් දීමනාවක් ලෙස නිර්වචනය නොවන බැවින්, මෙම දීමනාව සේවක අර්ථසාධක අරමුදලට, විශ්‍රාම වැටුප් අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් දායකත්වයට අදාළ යාන නොගත යුතු වුවත්, ඊට අනුකූල නොවන පරිදි කටයුතු කිරීම හේතුවෙන් ආයතනයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය වෙනුවෙන් ඉහත අරමුදල්වලට රු.61,940 ක් දායක මුදල් වැඩිපුර ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ඡේදයේ 28.5 වගන්තිය හා 28.6 වගන්තිය | ගමන අවසන් කොට දින 30 ක් ඇතුළතදී ගමන් වියදම් ඉල්ලුම්පත්‍රයක් ඉදිරිපත් කළයුතු අතර, ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද ගමන් වියදම් ඉල්ලුම්පත්‍ර සඳහා 28.6 වගන්තිය ප්‍රකාර ප්‍රමාද ගාස්තු අයකළ යුතු වුවත්, නියැදි පරීක්ෂාවන්ට අනුව අවස්ථා 10 කදී ප්‍රමාද වී ඉදිරිපත් කර තිබූ ගමන් වියදම් ඉල්ලුම්පත් වලින් රු. 18,726 ක ප්‍රමාද ගාස්තු අයකර නොතිබුණි. |
| (ඈ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසේ VII පරිච්ඡේදයේ 4.1 ඡේදය හා II කොටසේ IX පරිච්ඡේදය | සාමාන්‍ය කාර්යභාරයෙන් පරිභාහිර කටයුත්තක් වන තොග සමීක්ෂණ කටයුතු සාමාන්‍ය රාජකාරී වේලාවෙන් බැහැරව සිදුකරනවානම් අතිකාල හෝ නිවාඩු දින වැටුප් පමණක් ගෙවිය හැකි වුවත්, එම විධිවිධානයන්ට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ ජනවාරි මාසයේදී සාමාන්‍ය රාජකාරී කාලයන්හි නිමකර තිබූ 2013 වර්ෂයේ තොග සමීක්ෂණ කටයුතු වෙනුවෙන් සමීක්ෂණ මණ්ඩලයේ නිලධාරීන් 06 දෙනෙකුට එකතුව රු.79,090 ක තොග සමීක්ෂණ දීමනාවක් ගෙවා තිබුණි. |
| (ඉ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ II කොටස | |
| (i) VIII පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii) | තම රාජකාරියට අමතරව කරන සේවාවකින් උපයාගන්නා ගාස්තු ප්‍රමාණයෙන් සියයට 10 ක කොටසක් තමන් අයිති උසස් අධ්‍යාපන ආයතනයට ගෙවිය යුතු වුවද, ආයතනයේ සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.13,169,959 ක බාහිර දේශන ගාස්තු වලින් රු.1,316,996 ක් ආයතන අරමුදලට බැර කර නොතිබුණි. |

| | |
|---|---|
| (ii) IX පරිච්ඡේදයේ 2 හි 2.2 | අතිකාල දීමනා ගෙවිය හැක්කේ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දා වූ සාමාන්‍ය වැඩ කටයුතු වලින් ඒකාන්තයෙන් පරිබාහිර වූද, හදිසි වූද, සාමාන්‍ය කාර්යාල වේලාව තුළ කළ නොහැකිවූද වැඩ සඳහා පමණක් වුවත්, ආයතනයේ සේවයේ නියුතු නිලධාරීන්ට රාජකාරී පැවරුම්හි සඳහන් කටයුතු සඳහා අතිකාල වශයෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 2,094,403 ක් ගෙවා තිබුණි. |
| (ඊ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371 | තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය යුත්තේ අදාල කාර්යය සඳහා ප්‍රමාණවත් අග්‍රිමයක් වුවත්, අවස්ථාවන් 11 කදී වියදම් පියවීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩිපුර රු.69,658 ක අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) | තත්කාර්ය අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්ය නිමකළ විගසම පියවිය යුතු වුවත්, එකතුව රු.95,000 ක අත්තිකාරම් මාස 01 සිට මාස 11 ක කාල ප්‍රමාදයකින් පියවා තිබුණි. |
| (උ) 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ කාණ්ඩ අංක V | අමාත්‍යාංශ ලේකම්ගේ විධිමත් අනුමැතියක් නොමැතිව පෞද්ගලික සහකාරවරියට දුරකථන වියදම් රු.20,781 ක් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපූර්ණය කර තිබුණි. |
| (ඌ) 2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 09 ඡේදය | මානව සම්පත් අයවැය ලේඛණයක් පිළියෙල කර නොතිබුණි. |

(එ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 02,03,04,05,06 වගන්ති

පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් නඩත්තු කළයුතු වුවද, රු. 18,755,469 ක පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් එවැනි ලේඛණයක් නඩත්තු කර නොතිබුණි.

2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DMS/1528(A) හා 2014 ජුලි 01 දිනැති ලිපිය පදනම් කරගෙන සකස් කරන ලද 2014 ජුලි මස 17 දිනැති අංක 07/2014 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ ජුලි සිට දෙසැම්බර් දක්වා කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ නිලධාරීන් 45 දෙනෙකු වෙනුවෙන් දීමනා වශයෙන් රු.1,186,537 ක් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

(ආ) 2014 - 2017 වර්ෂ සඳහා සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම සඳහා ආචාර්යවරයෙකුට විධිමත් අනුමැතියක් නොමැතිව රු.150,000 ක ගෞරවාන්විත දීමනාවක් ගෙවා තිබුණි.

(ඇ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 ඡේදය සහ 2003 ජනවාරි 29 දිනැති අංක PE 1/174 11-2003 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය යන චක්‍රලේඛවල විධිවිධාන ප්‍රකාර විශ්වවිද්‍යාලය තුළ පවතින මධ්‍යස්ථානවල කටයුතු කිරීම සඳහා විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයට ගෙවීමේදී අමාත්‍ය මණ්ඩලයේ හා භාණ්ඩාගාරයේ අනුමැතිය නොලබා කෙටිකාලීන පාඨමාලා සම්බන්ධීකරණ කටයුතු කිරීම සඳහා දීමනා, දේශන ගාස්තු හා සහායකයින්ට ගෙවීම සඳහා ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.674,406 ක් ගෙවා තිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 41,865,313 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.34,250,533 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.7,614,780 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව පෞද්ගලික පඩිනඩි හා වේතන, අනෙකුත් පුනරාවර්තන වියදම් සහ බොල් ණය සහ අඩමාන ණය වෙන් කිරීම පිළිවෙලින් රු. 7,350,852, රු. 2,488,056 ක සහ රු. 2,872,912 කින් වියදමේ වැඩිවීමට වඩා වැඩි වේගයකින් අභ්‍යන්තර ඉපැයීම් හා රජයේ ආධාර මත ක්‍රමක්ෂය පිළිවෙලින් රු. 24,311,860 කින් සහ රු. 2,333,639 කින් වැඩිවීම වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 වර්ෂයේ පුස්තකාල පොත් සත්‍යාපනය කිරීමේදී හඳුනා නොගත් රු.280,255 ක් වටිනා පොත් 437 ක් සම්බන්ධයෙන් සහ සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් සත්‍යාපනයේදී මහඉලුප්පල්ලම පුස්තකාලයේ හඳුනා නොගත් පොත් 68 ක් සම්බන්ධයෙන් කිසිදු පියවරක් විගණන දින වන විටත් ගෙන නොතිබුණි.

(ආ) කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සුභ සාධක ආපනශාලාව පවත්වාගෙන යාම වෙනුවෙන් අයකරන ගාස්තු සහ ජල හා විදුලි ගාස්තු කාලීනව සිදුවන වෙනස්කම් අනුව, යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

4.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

2014 වර්ෂයේදී පාඨමාලා 07 ක් සඳහා ශිෂ්‍යයින් බඳවාගැනීමට ආයතනය අපොහොසත් වී තිබුණි.

4.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

තොග සමීක්ෂණ වාර්තාව අනුව වටිනාකම රු.391,249 ක් වූ චලනය නොවන තොග හා රු. 36,218 ක් වූ සෙමින් චලනය වන තොග හඳුනා ගෙන තිබුණු නමුත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් විගණන දින වන විටත් ගෙන නොතිබුණි.

4.4 හඳුනාගන්නා ලද පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පූර්ණ රක්ෂණ ආවරණය යටතේ රක්ෂණය කර තිබූ වටිනාකම රු. 800,000 ක් වූ වෑන්රථයක් අනතුරට පත් වී තිබුණද, එයට අදාළ හානි වටිනාකම් විගණන දිනය වූ 2015 පෙබරවාරි 20 වන දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයේදී රු. 358,456 ක් වටිනා පුස්තකාල පොත් 346 ක් අස්ථානගත වී ඇති බව අනාවරණය කර තිබුණු නමුත්, ඒ සඳහා වගකිවයුතු පාර්ශවයන් නිශ්චය කර අලාභ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

4.5 කාර්ය මණ්ඩල පරිපාලනය

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 18 ක් වුවත්, සේවයේ නියුක්තව ඇත්තේ රියදුරු සහ කම්කරු ශ්‍රේණිවල සේවකයන් 06 දෙනෙකු පමණි. අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු 10 ක් ඇතුළුව තනතුරු 12 ක් දීර්ඝ කාලයක සිට පුරප්පාඩු වී පවතින අතර, එම පුරප්පාඩු තනතුරු පිරවීමට විගණන දිනය වන විටත් කටයුතු කර නොතිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.3 ඡේදය පරිදි වර්ෂ 03 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර එම සැලැස්ම වාර්ෂිකව යාවත්කාලීන කර කළමනාකරණ මණ්ඩල අනුමැතිය ලබාගෙන සෑම වර්ෂයක් ආරම්භවීමට අවම වශයෙන් දින 15 කට පෙර විගණකාධිපති, භාණ්ඩාගාරය, රේඛීය අමාත්‍යාංශය හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව යන අය වෙත යොමු කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ සංයුක්ත සැලැස්ම සඳහා කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන තිබුණේ 2015 ජනවාරි 31 දින දීය.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

සංයුක්ත සැලැස්මේ ඇතුළත් අරමුණු ඉටුකර ගැනීම සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණද, ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් අරමුණු ඉටු කර ගැනීමේ ප්‍රගතිය කාලානුරූපව පරීක්ෂා කිරීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.

5.3 අභ්‍යන්තර විගණනය

ආයතනයේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබු අතර, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන ඒකකය මඟින් අභ්‍යන්තර විගණන කටයුතු මෙහෙයවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1) දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, පිළියෙල කළයුතු කාර්තුමය වාර්තා හා වාර්ෂික වාර්තා නියමිත දිනවකවානුවලදී පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අභ්‍යන්තර විගණන වැඩසටහනක් පිළියෙල කර තිබුණි. ඒ අනුව වර්ෂය තුළ පරීක්ෂා කළයුතු සියළුම අංශයන් පරීක්ෂාවට ලක්කර නොතිබුණු අතර, කරන ලද පරීක්ෂාවන් සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන වාර්තා 02 ක් පමණක් ඉදිරිපත් කර තිබුණි.

5.4 විගණන කමිටු

---

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය ප්‍රකාරව විගණන කමිටුව මගින් තම නිරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩල වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර, විගණන කමිටුවේ පහත සඳහන් කරුණු විෂය පථයට අදාල කර නොතිබුණි.

(අ) අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කර ගැනීම හා වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම

(ආ) ආයතන තුල ක්‍රියාත්මක වනු ලබන සියලු ක්‍රියාකාරකම් වලට අදාල අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය හා ඇගයීම් කිරීම

(ඇ) වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සඳහා නිරීක්ෂණයන් ඇතුලත් වාර්තා

(ඈ) රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා / මගපෙන්වීම් පිළිබඳ සමාලෝචනය

(ඉ) අභ්‍යන්තර / බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් සමාලෝචනයක් හා ඉදිරි ක්‍රියා මාර්ග

5.5 ප්‍රසම්පාදන සැලැස්ම

---

සමාලෝචිත වර්ෂය සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද, අවම වශයෙන් වසර 03 ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් කර නොතිබුණි.

5.6 අයවැය ලේඛනමය පාලනය

---

2003 ජුනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ප්‍රකාරව, වාර්ෂික අයවැය වාර්තාව වර්ෂයේ අරමුණු ඉටුකර ගැනීම පිණිස උපකරණයක් ලෙස යොදා ගෙන නොතිබීම හේතුවෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් සැසඳීමේදී වියදම් විෂයයන් 07 ක එකතුව රු.3,041,000 ක වියදම් සඳහා ඌන වෙන්කිරීමක් කර ඇති බවත්, වියදම් විෂයයන් 31 ක එකතුව රු. 11,385,000 ක වියදම් සඳහා අධි වෙන් කිරීමක් කර තිබුණි.

(ආ) අයවැයගත ආදායම්, තථ්‍ය ආදායම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 13 කට අදාළව රු.24,622,000 ක ආදායම් ඌනව තක්සේරු කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

-------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා වරින්වර අධ්‍යක්ෂවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය

(ආ) පර්යේෂණ ප්‍රදාන උපයෝජනය

(ඇ) මූල්‍ය කළමනාකරණය

(ඈ) සේවක කළමනාකරණය

(ඉ) ප්‍රසම්පාදනය

(ඊ) පුස්තකාල පරිපාලනය

(උ) පාඨමාලා මෙහෙයවීම / කළමනාකරණය

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**Audit Replies - විගණන පිළිතුරු වාර්තාව**

දිනය:2016.2.15

යොමු අංකය : සීඑල්-1/කේඩී/ජේ/ පීජීඅයිඒ/ඒඩී/2014/04
ඔබේ යොමුව : විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව වෙතටයි
විෂයය : විගණකාධිපති වාර්තාව 2014

---

ඔබ විසින් මා වෙත යොමු කරන ලද උක්ත අංක හා 2015.08.11 දිනැති අප විසින් 2015-08-20 දින ලද විගණකාධිපති වාර්තාවට අදාල හේතු පැහැදිලි කිරීම් පහත දැක්වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති

2014 අගෝස්තු මස 1 දින පැවති 45 වන විගණන කමිටු රැස්වීමේදී ලබා දුන් උපදෙස් පරිදි රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් විගණන වාර්තාවේ පෙන්වා දී ඇති පුස්තකාල පොත් හැර රු. 58,651,102 ක් වන අනෙකුත් වත්කම් ප්‍රත්‍යාගණනය කිරීම සඳහා 2014.12.02 දිනැති ලිපිය මගින් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලදි. ඒ අනුව තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක KD/විවිධ/014/A6 හා 2014.12.08 දිනැති ලිපිය මගින් ඉල්ලා සිටි වත්කම් ලේඛණ 2015.01.23 දින එම දෙපාර්තමේන්තුවට ලබා දීමෙන් පසු වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ කටයුතු ආරම්භ කොට 2015.03.12 දින සම්පූර්ණයෙන්ම අවසන් කරන ලදි. ඒ අනුව ප්‍රත්‍යාගණන වටිනාකම් ඇතුලත් සම්පූර්ණ වාර්තාව 2015.08.28 දින ආයතනයට ලැබුණු අතර අදාල වටිනාකම් ඇතුලත් කර ස්ථාවර වත්කම් ලේඛණය යාවත් කාලීන කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත. එසේම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අදාල ගිණුම්කරණ ගැලපීම 2015 වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන ගිණුම් වාර්තා වල ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව පරිඝනක තොරතුරු පද්ධතිය අස්පෘශ්‍ය වත්කමක් ලෙස වර්ගීකරණය කල නොහැකි අතර ආයතනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මගින්ද එසේ අනාවරණය කර නොමැත. ඒ අනුව වටිනාකම ආගණනය කිරීමකින් තොරව මිලදී ගැනීමක් ලෙස ආයතනය අත්පත් කරගෙන ඇති කළමණාකරණ තොරතුරු පද්ධතිය (MIS) කාර්යාල උපකරණ යටතේ වර්ගීකරණය කොට ක්ෂය ප්‍රතිපාදන කිරීමට කටයුතු කර ඇත.

2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

උපචිත වියදම් - රු. **1,094,418**

2014 වර්ෂයේ මුලු උපචිත වියදම් ප්‍රමාණය වන රු. 27,489,400.32 ට අදාල වන බාහිර දේශන ගාස්තු ලෙස උපචිත කර තිබූ රු. 22,745,251 ක් සඳහා වන උප ලේඛනය හා විවිධ

වියදම් සඳහා වන රු. 4,744,149.32 කට අදාල උපලේඛණ විගණනය සඳහා ඉදිරිපත් කර ඇති විගණන වාර්තාවේ පෙන්වා දී ඇති රු. 1,094,418 ක වටිනාකමට අදාල උපචිත අයිතමයන් නොමැති බව පෙනී යයි.

ලැබිය යුතු පාඨමාලා ගාස්තු - රු. **1,188,468**

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය හා යපුවා ටෙක් ආයතනය, සානා අතර අත්සන් කෙරුණු අවබෝධතා ගිවිසුමකට අනුව ව්‍යවහාරික සංඛ්‍යාන විද්‍යාපති උපාධිය හැදෑරීමට ලියාපදිංචි වූ සිසුන් 20 ක ගෙන් 2014 වර්ෂය සඳහා පාඨමාලා ගාස්තු හා ලියා පදිංචි ගාස්තු ලෙස ලද රු 1,188,468 ක මුදල, අදාල පාඨමාලා කටයුතු ආරම්භ වනුයේ 2015 වර්ෂයේ බැවින් ඉදිරියට ලද පාඨමාලා ගාස්තු ලෙස ගිණුම්ගත කර ඇත.

ඉදිරියට ලද පාඨමාලා ගාස්තු - රු. **24,114,499**

ඉදිරියට ලද පාඨමාලා ගාස්තු සම්බන්ධයෙන් වන උපලේඛනය විගණනය සඳහා ඉදිරිපත් කර ඇති බව දන්වා සිටින අතර අදාල ලේඛන අවශ්‍ය විටක විගණනය සඳහා ඉදිරිපත් කල හැක.

පර්යේෂණ දීමනා ගෙවීම

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2013.01.08 දිනැති හා අංක 1000 දරන චක්‍රලේඛය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2014.05.28 දිනැති හා අංක 05/2014(ii) දරණ ආයතන චක්‍රලේඛය ප්‍රකාරව පර්යේෂණ දීමනා සඳහා හිමිකම් ඇති නිලධාරීන් 05 දෙනෙකු විසින් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාථන සහා පර්යේෂණ කමිටුව (Senate Research Committee) වෙත අදාල යෝජනා ඉදිරිපත් කිරීමෙන් පසුව අදාල කමිටුව මගින් ලබා දුන් නිර්දේශයට අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන ආයතන අංශයේ 2014.08.20 දිනැති හා අංක AE/10 දරණ ලිපියට අනුව මහාචාර්ය එස්. සමිත මහතාට හා අයි. මුදන්නායක මහත්මියටද පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන ආයතන අංශයේ අංක E/10 හා 2014.10.24 දිනැති ලිපිය ප්‍රකාරව එස්. හේරත් මිය, එස්. පී. ජයකොඩි මහතා හා සී. දහනායක මහත්මියටත් මෙම පර්යේෂණ දීමනාව ගෙවීමට කටයුතු කර ඇති අතර අදාල පර්යේෂණ යෝජනා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සනාථන සහා පර්යේෂණ කමිටුවෙන් ලබා ගත හැකි බව දන්වා සිටිමි.

2.3. ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද විද්‍යා හා පුස්තකාල තැන්පතු උපලේඛනයේ සඳහන් 5438, 5793 හා 5854 යන ලියාපදිංචි අංක වලට අදාල ලියාපදිංචි දින පිළිවෙලින් 2005-10-29, 2005-11-10 හා 2005-11-05 ලෙස වෙනස් විය යුතු වේ. ඒ අනුව ආයතනයේ 2004

වර්ෂය දක්වා ලියාපදිංචි සිසුන්ගේ තැන්පතු මුදල් නිරවුල් කිරීමට මේ වන විටත් කටයුතු කර ඇත. එසේම උපාධිය අවසන් කිරීම සඳහා ලබා දී ඇති කාල සීමාව ඉක්මවා ගිය සිසුන්ට අදාල තැන්පතු මුදල් එම ශිෂ්‍යයන්ට ලිඛිතව දැනුම් දී ගෙවා නිදහස් කිරීමට හෝ ආයතනයේ ආදායමට ගැනීමට අවශ්‍ය කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතී.

නීති රීති රෙගුලාසි හා කළමණාකරණ තීරණ වලට අනුකූල නොවීම

(අ) 1974 අංක 02 දරන කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතන නියමාවලියේ

(i) 14 ජේදය

පෙර වර්ෂවල අධ්‍යයන මණ්ඩල සාමාජිකයින්ගේ සහභාගිත්වයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සාමාජිකයින්ගේ පැමිණීමේ කැපී පෙනෙන වර්ධනයක් පෙන්නුම් කෙරෙන අතර පැමිණීම සතුටුදායක නොවන සාමාජිකයන් සම්බන්ධයෙන් අදාල අධ්‍යයන මණ්ඩල වල ලේකම්වරුන් දැනුවත් කර එම සාමාජිකයන් අදාල අධ්‍යයන කමිටු වලින් ඉවත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ii) 14(7) ජේදය

ආයතන නියමාවලියට අනුව සෑම අධ්‍යයන මණ්ඩලයක් විසින්ම අවම වශයෙන් වර්ෂයකදී රුස්වීම් වාර 06 ක් පැවැත්විය යුතු වුවද කෘෂිකර්ම ආර්ථික විද්‍යා අධ්‍යයන මණ්ඩලය සහ ආහාර විද්‍යා හා තාක්ෂණික අධ්‍යයන මණ්ඩලය මගින් කමිටු වාර 05 ක් පමණක් පවත්වා ඇති බව පිලිගන්නා අතර ඉදිරියේදී එම රුස්වීම් වාරයද ආවරණය වන පරිදි රුස්වීම් වාර පවත්වන ලෙස අදාල අධ්‍යයන මණ්ඩල දැනුවත් කර ඇත.

(ආ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක පනත හා 2001 අගෝස්තු 24 දිනැති අංක ප්‍ර/ආයතන/11 දරන කම්කරු කොමසාරිස්ගේ ලිපිය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද 2013 ජනවාරි 08 දිනැති හා අංක 1000 දරණ චක්‍රලේඛයට අනුව මෙම දායක මුදල් ගෙවීම සිදු කර ඇත.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XIV වැනි පරිච්ජේදයේ 28.5 වගන්තිය හා 28.6. වගන්තිය

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ බාහිර දේශන පැවැත්වීමේදී අදාල විෂයයන් වල දේශන අවසන් කර විභාග පවත්වා ලකුණු නිකුත් කල පසු පමණක් ගෙවීම් කටයුතු සිදු කරනු ලැබේ. ඒ අනුව ගමන් වියදම් ප්‍රතිපූරණය කර ගැනීමේදී සලකා බලනු ලබන්නේ ගමන අවසන් කල දිනය නොව ඉහත දැක්වූ කොන්දේසි සපුරා ගෙවීම් කටයුතු සඳහා ඉල්ලුම් කල දිනයයි. කෙසේ වෙතත් 2015-07-24 පැවති අංක 32 දරණ මුදල් කමිටු රුස්වීමේදී ලබා දුන් නිර්දේශය හා 2015-09-03 දින පැවති

අංක 216 කළමණාකරණ මණ්ඩල රැස්වීමේදී ලබා දුන් නිර්දේශය මීලග විගණන කමිටු රැස්වීමට යොමු කර උක්ත කොන්දේසි සපුරා ගෙවීම සඳහා ඉදිරිපත් කෙරෙන අයදුම්පත්‍ර මත ප්‍රමාද ගාස්තු අය නොකිරීම සදහා අනුමැතිය ලබා ගනු ලැබේ.

(ඈ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ I කොටසේ vii පරිච්ඡේදයේ 4.1. ඡේදය හා II කොටසේ IX පරිච්ඡේදය

2013 වර්ෂයේ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ වාර්ෂික තොග සමීක්ෂණ කටයුතු සඳහා සම්බන්ධ වූ මාණ්ඩලික නිලධාරීන්ට ගෙවීම් කිරීමේදී සාමාන්‍ය අනුමත පටිපාටිය වන නිවාඩු දින දීමනා ගෙවීම සවස් කාලයේ සේවය කිරීම වෙනුවෙන් ලබා දිය නොහැකි බැවින් අදාල සමීක්ෂණ කාර්යයට සම්බන්ධ වූ නිලධාරීන් හා අනෙකුත් සේවකයින් සඳහා අදාල කාර්යය වෙනුවෙන් ගතවන කාලය සැලකිල්ලට ගෙන අතිකාල හා නිවාඩු දින ගෙවීම්වලට සමාන ගෞරව දීමනාවක් (Honorarium Allowance) ගෙවීමට 2013.11.29 දිනැති හා 203/17 අංක දරන කලමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත කටයුතු කර ඇත. කෙසේ නමුත් 2014 වර්ෂයේ සිට මේ සඳහා අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීමට පියවර ගෙන ඇත.

(ඉ)

(i) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ ii කොටසේ viii පරිච්ඡේදයේ 6.2 හි (ii) හා (iii). ඡේද

මෙම ආයතනයේ මූලික වශයෙන් බාහිර දේශකවරුන් ලෙස සේවය සපයනු ලබන්නේ විශ්වවිද්‍යාල වල සේවය කරනු ලබන අධ්‍යයන මණ්ඩල කාර්ය මණ්ඩලය විසින් වන අතර බොහොමයක් දේශන සති අන්ත හා නිවාඩු දිනවල පවත්වනු ලැබේ. එසේම අත්‍යවශ්‍ය අවස්ථාවලදී පමණක් සතියේ දිනවල ඉතා සුළු ප්‍රමාණයක් දේශන කටයුතු සිදු කරනු ලැබේ. එසේම මෙම දේශකවරුන්ගේ මුළු ඉපයීම් වන 10% හා 16% බැගින් උපයන විට බදු අයකිරීමක්ද සිදු කරන බැවින් ඉදිරියේදී මෙම රාජ්‍ය භාගය අයකර ගැනීමේ කොන්දේසියෙන් අදාල නිලධාරීන් නිදහස් කර ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව 2015.03.27 දින පැවති 49 වන විගණන කමිටු රැස්වීමේදී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අභ්‍යන්තර විගණක විසින් දන්වා සිටින ලදී. එසේම විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති පරිදි 13,169,959 ක වටිනාකමින් කාර්යාල වේලාවෙන් බාහිරව සිදු කරන ලද දේශන වලට අදාල වටිනාකම ගණනය කොට සම්පූර්ණ පිළිතුරක් විගණන අංශය වෙත ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ii) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ ii කොටසේ ix පරිච්ඡේදයේ 2 හි 2.2.

මෙම ආයතනයේ බොහොමයක් දේශන හා ප්‍රායෝගික කටයුතු පවත්වනු ලබන්නේ සති අන්ත දිනවල බැවින් කාර්යාල, දේශන ශාලා, පරිඝණක අංශය, අනෙකුත් අංශ හා

ශාපිකර්ම පීඨයේ විද්‍යාගාර සේවය නිරතුරුවම ලබා ගත යුතුව ඇත. එබැවින් අත්‍යවශ්‍ය සේවකයින්ගේ පමණක් අතිකාල සේවය ලබා ගෙන ඇති අතර. අනෙකුත් සේවකයින්ගේ අතිකාල සීමා කර ඇති බවද සටහන් කරමි. එසේම මීට පෙර විගණන වාර්තා මගින් හා පොදු කාරක සභාවේ නිර්දේශ මගින් පෙන්වා දුන් පරිදි සේවකයින්ගේ මූලික වැටුපෙන් 35% ක සීමාව මත පමණක් අතිකාල දීමනා ගෙවීමට කටයුතු කර ඇත.

(ඒ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**මුදල් රෙගුලාසි 371**

විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති පරිදි ඉදිරිපත් කරන ලද අයවැය ඇස්තමේන්තු සැලකිල්ලට ගෙන රු. 20,000.00 බැගින් අත්තිකාරම් මුදල් නිදහස් කලද අත්තිකාරම් පියවීමේදී අපේක්ෂිත පරිදි වියදම් දැරීමක් සිදුවී නොමැති බව පිළිගනිමු. එසේම 2015-03-27 දින පැවති 49 වැනි විගණන කමිටුවේදී ලබාදුන් නිර්දේශයට අනුව අත්තිකාරම් මුදල් ලබාගන්නා නිලධාරින්ගෙන් අදාල වියදම් නොදැරීම සම්බන්ධයෙන් හේතු පැහැදිලි කිරීම් ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

**මුදල් රෙගුලාසි 371 (2)**

විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති අත්තිකාරම් මුදල් අතරින් 2014.06.09 දින එස්. හේරත් මිය වෙත ගෙවන ලද රු. 5000.00 ක මුදල හැර ඉතිරි සියළුම මුදල් අත්තිකාරම් වශයෙන් ලබා දී ඇති මුදල් නොවන අතර ඒවා එම මුදල් වර්ෂය තුල අතුරු අග්‍රිම (Cash Imprest) ලෙස ලබා දී ඇති මුදල්ය.

(ට) **2010 සැප්තැම්බර් 01 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 446 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ කාණ්ඩ අංක V**

ඉහත (i) ඡේදයේ සඳහන් පරිදි රාජ්‍ය මුදල් චක්‍රලේඛය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් ආදේශ කර ගැනීමේදී එහි අංක VI කාණ්ඩය යටතේ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 922 හි සඳහන් මධ්‍යම හා පහළ ශ්‍රේණි වලට අයත් විධායක නිලධාරින්ට රු. 4,000.00 ක සීමාවට යටත්ව සන්නිවේදන වියදම් ප්‍රතිපූරණය කල හැකි බව දක්වා ඇත. ඒ අනුව කොමිෂන් සභා චක්‍රලේඛ අංක 922 ට අනුව පහළ විධායක ශ්‍රේණියට අයත් පෞද්ගලික සහකාර තනතුර සඳහා රු. 4,000.00 ක සීමාවකට යටත්ව දුරකථන වියදම් ප්‍රතිපූරණය කිරීමට කටයුතු කර ඇත. එසේම මෙම දීමනා ගෙවීම 2012 අංක 21 දරන මූල්‍ය කමිටුවේ නිර්දේශය හා 2012.11.12 දිනැති අංක 197.5 දරන කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත සිදුකර ඇත.

(ආ) 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන ව්‍යාපාර චක්‍රලේඛයේ 09 ඡේදය

විගණකාධිපති වාර්තාව මගින් පෙන්වා දී ඇති පරිදි මේ වන විටත් මානව සම්පත් අයවැය ලේඛනයක් පිළියෙල කරමින් පවතින අතර එහි පිටපත් අදාල ආයතන වෙත යැවීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

(ඇ) 2012 නොවැම්බර් 28 දිනැති අංක IAI2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය 02, 03, 04, 05, 06 වගන්ති

විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති පරිඝණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කර නොමැති බව පිළිගන්නා අතර තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම්ද ඇතුලත්ව භාණ්ඩාගාර ලේකම්ගේ අංක ZAI/2002/02 හා 2002.11.28 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛයේ උපදෙස් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් සකස් කොට ඉදිරියේදී විගණනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

25. ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2014-07-17 දිනැති හා 07/2014 අංක දරණ චක්‍රලේඛ ප්‍රකාරව 2011/2012 පාදක අධ්‍යයන වර්ෂය සැලකිල්ලට ගෙන අතිරේක සිසුන් බඳවා ගැනීම වෙනුවෙන් ආයතනයේ කාර්ය මණ්ඩලය වෙනුවෙන් 20% ක දීමනාවක් ගෙවීමට කටයුතු කර ඇත. ඒ අනුව, පාදක අධ්‍යයන වර්ෂය ලෙස සැලකිල්ලට ගත් 2011/2012 අධ්‍යයන වර්ෂය වෙනුවෙන් ලියාපදිංචි වී සිටි සිසුන් 388 ට සාපේක්ෂව 2012/2013 අධ්‍යයන වර්ෂයේ සිසුන් 430ක් බඳවා ගැනීමට ආයතනය සමත් වී ඇති අතර 2011/2012 අධ්‍යයන වර්ෂයේ සමස්ථ පාඨමාලා හා ලියාපදිංචි ගාස්තු ආදායම වූ රු. 34,619,133.33 ක වටිනාකම 2012/2013 අධ්‍යයන වර්ෂයේදී රු. 61,514,526.71 දක්වා වැඩිකර ගැනීමට කටයුතු කර ඇති බවද දන්වා සිටිනු ලැබේ.

(ආ) විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති රු.150,000.00 ක ගෞරව දීමනාව ආචාර්ය එස් එස් ඊ රණවන මහතාට ගෙවා තිබුණේ 2014-2017 වර්ෂ සඳහා ආයතනයට සංයුක්ත සැලැස්මක් සකස් කිරීමද ඇතුළුව ශිෂ්‍ය අත්පොත (Student Handbook), ආයතනය සඳහා වන අභ්‍යන්තර නීති හා රෙගුලාසි සකස් කිරීම (Rules, Regulations & By-Laws), සිසුන් සහ ආචාර්‍ය මණ්ඩලය සඳහා ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීම (Code of Ethic) සහ ආයතනය සඳහා කාර්යදාම අත්පොතක් සකස් කිරීම (Manual of Procedure) වෙනුවෙනි. මෙම ගෙවීම 2013-09-27 දිනැති අංක 202 දරණ කළමණාකරණ මණ්ඩලයේ හා 2013-05-28 දිනැති අංක 420 දරණ පාලක සභා රැස්වීමේ අනුමැතිය මත සිදුකොට ඇති බව දන්වා සිටිමි.

(ඇ) කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය මගින් පවත්වනු ලබන කෙටිකාලීන වැඩ මුළු වල සම්බන්ධීකරණ/සහාය කටයුතු වෙනුවෙන් හා දේශන හා ප්‍රායෝගික පරීක්ෂණ කටයුතු සඳහා සූදානම් වීමට වැය වන කාලය හා විශේෂඥ දැනුම සැලකිල්ලට ගෙන සාමාන්‍ය දේශන හා ප්‍රායෝගික ගාස්තු වලට වඩා වැඩි ගෙවීමක් මුදල් කමිටුවේ නිර්දේශය මත හා කළමණාකරණ මණ්ඩල රැස්වීමේ අනුමැතිය ලබාගෙන අනුමත ඇස්තමේන්තුවට අනුව සම්බන්ධීකාරක දීමනා, සහායක දීමනා හා දේශන ගාස්තු ගෙවා ඇත.

3 මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

විගණකාධිපති වර්තාවේ ආයතනයේ මූල්‍ය සමාලෝචනය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු නිවැරදි බව දන්වා සිටිමි.

4 මෙහෙයුම් සමාලෝචනය

4.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

(අ) 1995 වර්ෂයේ පුස්තකාල පොත් සත්‍යාපනය කිරීම. අදාල කාර්‍ය මණ්ඩලය විසින්ම විධිමත් පටිපාටියකින් තොරව සිදු කර ඇති බැවින් එහි හඳුනාගත නොහැකි බවට සඳහන් කොට තිබූ පොත් 437ක් සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයක් ගැනීමට නොහැකි වූ අතර 2014 වර්ෂයේ සිදු කරනලද පුස්තකාල පොත් සත්‍යාපනයේදී මහඉලුප්පල්ලම පුස්තකාලයේ හඳුනාගැනීමට නොහැකි බවට පෙන්වා දී තිබූ පොත් 68ක් සම්බන්ධයෙන් එම පුස්තකාලය භාරව සිටි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනියගෙන් ලබා ගත් නිරීක්ෂණයන් කළමණාකරණ මණ්ඩලය මගින් පත් කරන ලද විශේෂ කමිටුවකට යොමු කොට මේ සම්බන්ධයෙන් වන ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.

(ආ) ආපනශාලාවේ ජල සහ විදුලි බිල් සඳහාද එහි වටිනාකම අලුතින් තක්සේරු කිරීමෙන් අනතුරුව වර්තමාන තත්ත්වයට සරිලන මිලක් අය කර ගැනීමට ඉදිරියේදී කටයුතු කරමි.

4.2. මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණකාධිපති වාර්තාවට අනුව පහත සඳහන් පාඨමාලා සඳහා කිසිදු සිසුවෙක් ලියාපදිංචි වී නොමැති බව දක්වා ඇතත් 2014 අධ්‍යයන වර්ෂයට අදාලව එම පාඨමාලාවන් සඳහා පහත පරිදි සිසුන් ලියාපදිංචි වී ඇත.

| | | | |
|---|---|---|---|
| I. | Ph.D (R) in Agricultural Biology | - | 04 |
| II. | Ph.D (R) in Crop Science | - | 09 |

III. Ph.D (R) in Food Science & Technology - 01
IV. M.Phill. Agricultural Extension - 03
V. M.Phill. Crop Science - 09
VI. M.Phill Food Science & Technology - 03
VII. M. Phill Agriculture Biology - 04

කෘෂිකර්ම පශ්චාත් උපාධි ආයතනයට පර්යේෂණ සිසුන් බඳවා ගනු ලබන්නේ ඒ ඒ අධ්‍යයන මණ්ඩලයට ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට හා පර්යේෂණ යෝජනාවලිය ඉදිරිපත් කිරීමට භාජනය කිරීමෙන් අනතුරුවය. මෙහිදී එම සිසුන් සම්මුඛ පරීක්ෂණයේ හා පර්යේෂණ යෝජනා වලින් ඉදිරිපත් කිරීමෙන් (Research Proposal Presentation) ලබාගත්තා කුසලතාව මත අදාල අධ්‍යයන මණ්ඩලයෙන් නිර්දේශය මත අදාල පර්යේෂණ සිසුන් බඳවාගනු ලැබේ. එමෙන්ම සමහර වර්ෂවලදී පර්යේෂණ උපාධි සඳහා සිසුන් අයදුම් කළද අදාල අයදුම්කරුවන් නියමිත විෂය ක්ෂේත්‍රයට අදාල නොවන්නේ නම් ඔවුන් පාඨමාලාව සඳහා බඳවා ගනු නොලැබේ.

## 4.3 නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්

2014-12-31 දිනට සිදුකරන ලද තොග සමීක්ෂණ වාර්තාව 2015-01-25 දින ආයතනයට ලැබුණු අතර එය 2015-02-27 දින පැවති 29 වැනි මුදල් කමිටුවට ඉදිරිපත් කොට එහි නිර්දේශ එදිනම පැවති 211 වැනි කළමණාකාරණ මණ්ඩලයට යොමුකොට පත්කර ගත් විශේෂ කමිටුවකට මෙම වාර්තාව මේ වනවිටත් යොමුකොට ඇත. ඒ අනුව, අදාල කමිටුවේ නිර්දේශ මත චලනය නොවන තොග සහ සෙමින් චලනය වන තොග සම්බන්ධයෙන් ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

## 4.4. හඳුනාගත්තා ලද අඩුපාඩු

(අ) හානියට පත්වූ වාහනය සබ්බන්ධයෙන් වන රක්ෂණ හිමිකම ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත 2014-03-27 දින අයදුම්කරන ලද අතර අදාල වාහනය සම්පූර්ණයෙන් හානියට පත්වූ වාහනයක් ලෙස සලකා රු. 650,000.00 මුදලක් ආයතනය වෙත ගෙවීමට 2014-11-04 දිනැති හා අංක V/CH/1/010/1017567/2014 දරණ ලිපිය මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එකග වී තිබුණි. ඒ අනුව හානියට පත් වූ වාහනයට අදාලව මුදල් රෙගුලාසි අංක 104 හි ප්‍රතිපාදනවලට අනුකූලව ගත යුතු ඉදිරි ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් කටයුතු කිරීමට 2014-07-26 දිනැති අංක 207 දරණ කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය මත පුද්ගලයින් 04 දෙනෙකුගෙන් සමන්විත විශේෂ කමිටුවක් 2014-09-11 දින පත්කරන ලදි. එහෙත් රක්ෂණ සංස්ථාව විසින් ලබා දීමට එකගවූ අදාල වන්දි මුදල

සම්බන්ධයෙන් කමිටුව එකගතාවයක් නොදැක්වූ අතර රක්ෂිත පූර්ණ වටිනාකම ලබාදෙන ලෙස 2014-11-28 දිනැති ලිපිය මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත ඉල්ලීමක් කරන ලදි. අදාල ඉල්ලීම සැලකිල්ලට ගෙන වන්දි වටිනාකම රු. 750,000.00 ක් දක්වා වැඩි කිරීමට 2014-12-15 දිනැති අංක V/CH/1/010/1017567/2014 දරණ ලිපිය මගින් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව එකගතාව පලකල මුත්. මෙම වටිනාකමටද කමිටුව එකගතාවය පළනොකල අතර 2015-01-23 දිනැති ලිපිය මගින් පූර්ණ රක්ෂිත මුදලම ලබාදෙන ලෙස නැවත ඉල්ලම් කරන ලදි. අදාල ඉල්ලීම් සලකා බලා වාහනයේ පූර්ණ රක්ෂිත මුදල වන රු. 800,000.00 ගෙවීමට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව 2014-03-10 දිනැති අංක V/CH/1/010/1017567/2014 දරණ ලිපිය මගින් එකගතාවය පල කර අතර 2015-03-19 වන දින රුස්වූ කමිටුව විසින් එය පිලිගන්නා ලදි. ඒ අනුව පූර්ණ රක්ෂිත වටිනාකම ගෙවීමේ කොන්දේසියට යටත්ව අනතුරෙන් අබලි තත්ත්වයට පත් වාහනයේ අයිතිය ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙත පවරා 2015-04-01 දින භාරදීමට කටයුතු කරන ලදි. ඒ අනුව 2015.04.29 දින රු. 796,050 ක මුදලක් ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විසින් අප ආයතනය වෙත ගෙවා ඇත.

(ආ) කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ කෘෂි පුස්තකාලයේ භෞතික පොත් සත්‍යාපනය කිරීමේ කටයුතු 2014-07-25 වන දින ආරම්භ කොට අගෝස්තු මස 10 වන දින අවසන් කරන ලද අතර එහි අවසන් වාර්තාව 2014-11-10 වන දින අධ්‍යක්ෂකවරයාට යොමුකරන ලදි. ඒ අනුව එම වාර්තාවේ සඳහන් නැතිවූ පොත්පත් සහ වාර සගරා සම්බන්ධයෙන් පුස්තකාලය භාරව සිටි ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිනිය විසින් 2015-01-30 සහ 2015-03-03 දින අධ්‍යක්ෂකවරයා වෙත ලබා දෙන ලද නිරීක්ෂණයන් ඇතුලත් වාර්තාව ආයතනයේ කළමණාකරණ මණ්ඩලය මගින් පත්කරන ලද පුද්ගලයන් තිදෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවකට මේ වන විටත් යොමු කොට ඇත. ඒ අනුව. අදාල කමිටුවේ නිර්දේශ ලද විගස එය කළමණාකරණ මණ්ඩලයට යොමු කොට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ.

4.5. කාර්ය මණ්ඩල පරිපාලනය

මහාචාර්ය/බාහිර මහාචාර්ය/ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය - ii ශ්‍රේණිය

විගණකාධිපති වාර්තාවේ සඳහන් පුරප්පාඩු වී ඇති මහාචාර්ය තනතුරු 03, බාහිර මහාචාර්ය තනතුරු 02 හා ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය තනතුරු 03 පිරවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත්කර ඇති අංක යූජීසී/එච්/ආර්/09/01/59 හා 19/03/2008 දිනැති ලිපිය අනුව ආයතනයේ අවශ්‍යතාවය මත උපයන ආදායමින් සිදු කිරීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අවශ්‍ය අවස්ථාවලදී කෙටි කාල සීමාවන් සඳහා මෙම තනතුරු සඳහා අධ්‍යයන මණ්ඩල වල නිර්දේශයන් යටතේ ආචාර්යවරුන් සේවයට බඳවා ගන්නා ලද

ඉදිරියේදී මෙම තනතුරු පිරවීමට කටයුතු කරනු ලැබේ. තවද ජ්‍යෙෂ්ඨ කතිකාචාර්ය - (ශ්‍රේණිය) තනතුරු 3න් එක් තනතුරක් සඳහා වන ප්‍රතිපාදන උපයෝගී කරගෙන ව්‍යාපාර කළමනාකරණ (MBA) අධ්‍යයන මණ්ඩලය සඳහා නිබන්ධකවරයෙකු (Tutor) ලෙස ඩී. එම්. කේ. දිසානායක මහතා 2015.01.01 දින සිට බඳවා ගෙන ඇති අතර කළමණාකරණ මණ්ඩලයේ නිර්දේශය හා පාලක සභාවේ අනුමැතිය මත කෘෂි ව්‍යාපෘති අධ්‍යයන මණ්ඩලය සඳහා නිබන්ධකවරයෙකු (Tutor) 2015-09-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පත් කර ගැනීමට කටයුතු කර ඇත.

<u>සම්බන්ධීකාරක තනතුර</u>

පුරප්පාඩු වී පැවතුණු සම්බන්ධීකාරක තනතුර සඳහා ටී. ජ් .ජ්. එන් සිරිවර්ධන මහතා 2015.04.10 දින සිට බඳවා ගැනීමට කටයුතු කර ඇත.

<u>ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති තනතුර</u>

මෙම තනතුර පුරප්පාඩු වූයේ 2014.11.14 දින සිට වන අතර එම පුරප්පාඩුව පිරවීම සඳහා 2014.10.24 දින පුවත්පත් දැන්වීමක් පල කරන ලදි. ඒ අනුව පුද්ගලයින් තිදෙනෙකු අයදුම් කර තිබූ අතර ඉන් එක් පුද්ගලයෙකු පමණක් සුදුසුකම් සපුරා තිබුණි. ඒ අනුව 2015.01.25 දින පැවති කලමනාකරණ කමිටු රුස්වීමේ අනුමැතිය මත පත් කරන ලද තේරීම් කමිටුව විසින් සම්මුඛ පරීක්ෂණයක් පවත්වන ලදි. එහෙත් තේරීම් කමිටුව අයදුම්කරුවන් බඳවා ගැනීම සඳහා නිර්දේශ නොකරන ලද අතර ප්‍රමාණවත් තරම් අයදුම්කරුවන් නොසිටි බැවින් මෙම තනතුර සඳහා නැවත අයදුම්පත් කැඳවීමටත් එහිදී සහකාර පුස්තකාලයාධිපතිවරුන්ටත් විවෘත වන පරිදි අයදුම්පත් කැඳවීමට නිර්දේශ කරන ලදි. ඒ අනුව අදාල නිර්දේශ කලමනාකරණ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව නැවත අයදුම්පත් කැඳවීමටත් මේ වන විටත් කටයුතු කර ඇත.

<u>රියදුරු තනතුර</u>

මෙම තනතුර සඳහා පැවරුම් පදනම මත බඳවා ගත් රියදුරු මහතාගේ සේවය ස්ථිර කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා ගැනීමට කටයුතු කරමින් පවතින අවස්ථාවේ ඔහු අතින් අප ආයතනයේ 60-5134 වැන් රථය හදිසි අනතුරකට ලක් වීම හේතුවෙන් ඔහුගේ කොන්ත්‍රාත් කාලය දීර්ඝ නොකෙරුණු අතර ආයතනයේ කලමනාකරණ මණ්ඩලයේ අනුමැතිය හා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පාලක සභා රුස්වීමේ අනුමැතිය මත එම රියදුරු මහතාගේ සේවය අවසන් කිරීමට සිදුවුණු අතර සේවය ස්ථිර කිරීමට කර තිබූ ඉල්ලීම ඉවත් කර ගැනීමට සිදුවුණු අතර ඒ සඳහා 2015.01.27 දින පැවති පාලක සභාවේ අනුමැතිය 2015.02.15 දින අප වෙත ලැබුණු අතර ඒ අනුව නැවතත් එම තනතුර පිරවීමට අවශ්‍ය අයදුම්පත් කැඳවා ඇති අතර එම පුරප්පාඩු වූ තනතුර පිරවීමට කටයුතු කරමින් පවතී.

කම්කරු නතතුර

එක් කම්කරු නතතුරක් ආයතනයේ සිසුන්ගේ අවශ්‍යතාවය මත ඉදිකිරීමට යෝජිත නේවාසිකාගාරය සඳහා අවශ්‍ය නේවාසිකාගාර භාරකරු නතතුර වෙනුවෙන් පරිවර්තනය කිරීමට අවශ්‍ය අනුමැතිින් ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතී. පුරප්පාඩු වී ඇති අනෙක් කම්කරු නතතුර පිරවීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා මේ වන විටත් යොමු කර ඇත

ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1. සංයුක්ත සැලැස්ම

2014-2017 කාල පරිච්ඡේදය සඳහා සකස් කරන ලද සංයුක්ත සැලැස්ම 2013 වර්ෂයේ සිට කළමණාකරණ මණ්ඩලයේ අඛණ්ඩව සාකච්ඡා කොට මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වැඩමුළු මාලාවක් මගින් ලබා දුන් උපදෙස් සැලකිල්ලට ගෙන 2014 ජූලි මස 16 දින උසස් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පවත්වන ලද වැඩමුළුවකදී භාරදීමට කටයුතු කර ඇත. ඒ අනුව අවසන් සංශෝධිත සංයුක්ත සැලැස්ම සඳහා 2015 ජනවාරි 31 වන දින පැවති කළමණාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇත.

5.2. ක්‍රියාකාරී සැලැස්ම

ආයතනයේ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවටත් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයටත් වර්ෂය තුළ අවස්ථා දෙකකදී වාර්තා කිරීමට කටයුතු කොට ඇති අතර එහි පිටපත් ආයතනයේ ගිණුම් අංශයේ පවත්වාගෙන යනු ලබන අතර අවශ්‍ය විටක විගණනය සඳහා ඉදිරිපත් කළ හැක.

5.3. අභ්‍යන්තර විගණනය

(අ) ආයතනයේ අභ්‍යන්තර විගණන කටයුතු විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් ඉටු කරනු ලැබේ. ඔවුන් සතුව තිබෙන සම්පත් උපයෝගී කර ගෙන විශ්වවිද්‍යාලයේ සහ අනුබද්ධ ආයතන/මධ්‍යස්ථාන වල අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කරනු ලබයි. ඔවුන් විසින් ඉටු කරනු ලබන සියලු කාර්යයන් ඇතුලත් කර පිළියෙල කරනු ලබන කාර්තුමය හා අර්ධ වාර්ෂික වාර්තා විශ්වවිද්‍යාලයීය විගණන කමිටුවට වාර්තා කරනු ලබයි. එහි පිටපත් කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය වෙතද ලබා දීමට කටයුතු කර ඇත.

(ආ) අයතනය සඳහා නියමිත පත් කල අභ්‍යන්තර විගණන කාර්ය මණ්ඩලයක් නොමැති අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය හා අනුබද්ධ කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි

ආයතනය හා අනෙකුත් මධ්‍යස්ථාන වලද විගණන කටයුතු සිදු කරනු ලැබේ. එහෙයින් පවතින සීමිත සම්පත් උපයෝගී කර ගෙන 2014 වර්ෂය තුළදී ඉටු කළ හැකි ප්‍රමාණයෙන් අභ්‍යන්තර විගණන වාර්තා 02 ක් පමණ නිකුත් කර ඇත.

## 5.4. විගණන කමිටු

විගණකාධිපති වාර්තාවේ පෙන්වා දී ඇති කරුණු අතරින් අභ්‍යන්තර විගණන ඒකකයේ වගකීම් නිශ්චය කර ගැනීම හා වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම, වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීම සඳහා නිරීක්ෂණයන් ඇතුලත් වාර්තා, රාජ්‍ය ව්‍යාපාර කමිටුවට ඉදිරිපත් කරන ලද යෝජනා/ මග පෙන්වීම් පිළිබඳ සමාලෝචනය, අභ්‍යන්තර/ බාහිර විගණන වාර්තා, කළමනාකරණ ලිපි සම්බන්ධයෙන් සමාලෝචනය හා ඉදිරි ක්‍රියාමාර්ග යන කරුණු සැම විගණන කමිටුවකදීම සාකච්ඡා කිරීමටත් එහි නිර්දේශයන් කළමණාකරණ මණ්ඩලයේ අවධානයට යොමු කිරීමටත් කටයුතු කොට ඇත.

## 5.5. ප්‍රසම්පාදන සැලැස්ම

කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය සඳහා වාර්ෂිකව ලබාදෙනු ලබන භාණ්ඩාගාර ප්‍රතිපාදන ප්‍රමාණය වාර්ෂික පදනමකින් ලබා දෙන අතර ඒ අනුව වාර්ෂික අයවැය ලේඛණය හා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කරනු ලැබේ. ඒ අනුව රජය මගින් ලබාදෙන ප්‍රතිපාදන ප්‍රමාණය නිශ්චිතව ඇස්තමේන්තු කළ නොහැකි බැවින් වසර 3ක් වැනි දීර්ඝ කාලයකට ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගික නොවන බැවින් වාර්ෂික පදනමෙන් සකස් කර ඇති බව දන්වා සිටිමි.

## 5.6. අයවැය ලේඛනමය පාලනය

(අ) අයැවය ලේඛණය සකස් කිරීමෙන් පසුව නිකුත් කරන ලද චක්‍රලේඛ ප්‍රකාරව ආදායම් හා වියදම් ශීර්ෂ වල විචලනාවයන් දක්නට ලැබුණු අතර විවිධ හේතුන් මත අපේක්ෂිත පරිදි වියදම් දැරීම හා නොදැරීම හේතු කොට ගෙන වැය ශීර්ෂ වල ඌන හා අධි වෙන් කිරීම් ඇති විය. ඉදිරි වර්ෂ සඳහා අයවැය ලේඛණය පිළියෙල කිරීමේදී විශේෂ අවධානයක් යොමු කර විචලනාවයන් අවම වන පරිදි වඩා තාත්වික පදනමක් මත අයවැය ලේඛණය සකස් කිරීමට වගබලා ගනිමි.

(ආ) අයවැයගත ආදායම් හා තථ්‍ය ආදායම් අතර විචලනයන් අවම වන ලෙස තාත්වික පදනමක් මත අයවැය ලේඛනය පිළියෙල කිරීම සඳහා ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

[illegible] හා පාලනයන්

විගණකාධිපති වාර්තාවේ සඳහන් කර ඇති අභ්‍යන්තර පාලනයේ දුර්වලතා ඇති ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරන ලෙස අදාල අංශ ප්‍රධානීන් හා කාර්ය මණ්ඩලය මේ වන විටත් දැනුවත් කොට ඇත.

ඔබගේ විගණකාධිපති වාර්තාව සඳහා කරන ලද ඉහත දැක්වෙන සියළු පැහැදිලි කිරීම් නිවැරදි බවට මා විසින් පුද්ගලිකවම සහතික වෙමි.

මහාචාර්ය එස්. සමිත 15/02/2016
අධ්‍යක්ෂ
කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනය

පිටපත් - 1. ලේකම්, උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය
2. සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
3. ලේකම්, මුදල් අමාත්‍යාංශය
4. උප කුලපති, පේරාදෙණිය විශ්වවිද්‍යාලය